**වර්ෂ 2022 දෙසැම්බර් මස 09 වන දින පෙ.ව. 09.30 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-**

- <u>සභාපතිතුමා මූලසුන ගැනිම</u> :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාවේ පෙ.ව. 9.30 වන විට සණ පූර්ණය නොමැති හෙයින් විසින් මහ සභාවේ කටයුතු පෙ.ව. 09.45 දක්වා කල්තැබීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය විසින් ස්ථිර කරන ලදී.

පැමිණීම - මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රිතුමන්ලා සහ ගරු මන්ත්‍රිතුමියන්ලා සහභාගි විය.

| අනු.අ තනතුර | පක්ෂය | නම | පැමිණීම |
|---|---|---|---|
| 1. ගරු සභාපති | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමරත්න මල්කැකුල මහතා | පෙ.ව. 08.15 |
| 2. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමා ගම්ලත් මිය | පෙ.ව. 08.20 |
| 3. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.ජ්.මහින්ද විජේකුමාර මහතා | පෙ.ව. 08.21 |
| 4. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා | පෙ.ව. 08.21 |
| 5. ගරු ප්‍රාසම | එ.ජා.ප | නයනා ජීවනි අතුකෝරල මිය | පෙ.ව. 09.00 |
| 6. ගරු ප්රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර් .සෝමරත්න මහතා | පෙ.ව. 09.12 |
| 7. ගරු ප්‍රාසම | එ.ජා.ප. | ජී.ඊ.ඒ.රනිල් එදිරිසිංහ මහතා | පෙ.ව. 09.20 |
| 8. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.එම්. ජයරත්න මහතා | පෙ.ව. 09.21 |
| 9. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.කේ. දයා කස්තුරි මිය | පෙ.ව. 09.25 |
| 10. ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | රොෂාන් දේශප්‍රිය මහතා | පෙ.ව. 09.25 |
| 11. ගරු ප්‍රාසම | එ.ජා.ප. | අයි.කේ.රංජන් ප්‍රදීප් මහතා | පෙ.ව. 09.25 |
| 12. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩී.එම්. ශානක දර්ශන මහතා | ප.ව. 09.26 |
| 13. ගරු ප්‍රාසම | ජ.වි.පෙ | එම්.ඩබ්.විකසිත පුෂ්පසූරිය මහතා | පෙ.ව. 09.26 |
| 14. ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | ඩබ්.කේ.තිලකාවති මිය | පෙ.ව. 09.26 |
| 15. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මංගල කිත්සිරි ඩයස් මහතා | පෙ.ව. 09.30 |
| 16. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.ඒ.අසංක දිල්ෂාන් මහතා | පෙ.ව. 09.35 |
| 17. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රුවන් අශෝක පතිරණ මහතා | පෙ.ව. 09.35 |
| 18. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | දීප්ති චන්දන මහතා | පෙ.ව. 09.50 |
| 19. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.කේ. විජේසිරි මහතා | පෙ.ව. 09.50 |
| 20. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.ටී.චන්ද්‍රලතා මිය | පෙ.ව. 09.50 |
| 21. ගරු ප්‍රාසම | එ.ජා.ප | ඉන්ද්‍රානි වික්‍රමසිංහ | පෙ.ව. 09.51 |
| 22. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කැළුම් ශ්‍රී ධර්මදාස මහතා | පෙ.ව. 10.00 |
| 23. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රවීන් විනෝද් මහතා | පෙ.ව. 10.25 |
| 24. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.ඩබ්.ජනක විමලසිරි මහතා | පෙ.ව. 10.27 |
| 25. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා | පෙ.ව. 10.15 |
| 26. ගරු ප්‍රාසම | ජ.වි.පෙ | ජී.ඒ.ජයසිංහ මහතා | පෙ.ව. 10.30 |
| 27. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.එච්.අසංක එරන්ද මහතා | පෙ.ව. 10.30 |
| 28. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එම්.ජී.ධනංජය වීරසේකර මහතා | පෙ.ව. 10.31 |
| 29. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.ඩබ්.එස්.සම්පත් බොතේජු මහතා | පෙ.ව. 10.32 |
| 30. ගරු උපසභාපති | ශ්‍රී.ල.පො.පෙ | ඒ.ජේ.අනිල් ලියනගේ මහතා | පෙ.ව. 10.53 |
| 31. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.ඩබ්. ජයලත් මහතා | පෙ.ව. 10.55 |
| 32. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩබ්.එම්.මදූෂාණි වීරසිංහ මිය | පෙ.ව. 10.55 |
| 33. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.රත්නසිරි මහතා | පෙ.ව. 10.58 |
| 34. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.ඒ.දේවින්ද කුමාර මහතා | පෙ.ව. 10.59 |
| 35. ගරු ප්‍රාසම | එ.ජා.ප. | කේ.එල්.එම්.ඩී.කරදන මිය | පෙ.ව. 11.30 |
| 36. ගරු ප්‍රාසම | ශ්‍රී .ල.පො.පෙ | ජීවන් රණතුංගමහතා | ප.ව. 11.40 |
| 37. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර්.ඩිලාන් දර්ශන රණසිංහ මහතා | පෙ.ව. 11.40 |
| 38. ගරු ප්‍රාසම | එ.ජා.ප | අයි.කේ.කුලරත්න මහතා | පෙ.ව. 11.48 |
| 39. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මාලනී පීරිස් මිය | පෙ.ව. 11.48 |
| 40. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | බී.ජී.ජීවන් අබේවික්‍රමපාල මහතා | පෙ.ව. 11.50 |

2022.12.09 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ **2022.11.11** වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව ස්ථිර කිරීම උද්ධෘතය

## 01-01 සභා වාර්තාව සභා සම්මත කිරීම.-(2022.11.11 )

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා :-**

2022.11.11 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය :-**

2022.04.08 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරිමේ යෝජනාව ස්ථිර කරමි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

මම අද ආරාධනා කලා මාධ්‍ය කපිල මහතාට මේ වසර 5කට පස්සේ අද සභා දිනය සමරුවක් ලෙස වීඩියෝ එකක් කරගන්න.කැමති අය ඩිඩියෝ එකක් කරගන්න.

සංශෝධන 01.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා**

පසුගිය න්‍යාය පත්‍රයේ සඳහන් නොවූ කරුනු , ඇස්තමේන්තු ආදිය පිලිබඳව කතාකරලා වාර්තාවට ඇතුලත්.අංක 5-35න් අවසන් විය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි මිය :-**

රීති අනුව වැරදියි. න්‍යායපත්‍රයේ තියෙන ඒවා විතරයි නීත්‍යානුකූල.ඉක්මනට සංවර්ධනය කරන්න වෙන්න ඇති ඇස්තමේන්තු තියෙන්නේ.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

මෙ ඇස්තමේන්තු කලින් න්‍යා පත්‍රයට දාන්න බැරි ඒවා හදලා නෑ ඒ වෙනකොට.ප්‍රායෝගිකව ඒ කටයුත්ත කරන්න බෑ.

සංශෝධන 02.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**

නාමල්දෙනිය විදුලි බල ඒ අයමයි ගෙවන්න ඕනි. ඒක සභාවෙන් ගෙවන්න බෑ. මම විරුද්ධත්වය ප්‍රකාශ කලා.

සංශෝධන 03

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් ජයරත්න මහතා**

කුඩා ජලවිදුලි බලාගාර ගිවිසුම්ගතවූබව දැනුම්දෙන්න.සභාවට මිලදිගත් ස්විච්වල වර්ගය මොකක්ද කියලා මේ සභාවට ඉදිරිපත්කරන්න.

සංශෝධන 04

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2022 භාණ්ඩ සමීක්ෂනයේ අධීක්ෂන නිලධාරින් ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරි ජී.ඒ.අයි.එන්.සෝමරත්න මිය හා එම්.එන්.සී. සෝමරත්න මිය ගේ නම් 22.11.11. සභා වාර්තාවේ අංක 05-25 සභා තීරනයට ඇතුලත් විය යුතුය.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

> **Xxxxxxxxxxxxx 2022.11.11** වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව **ඒකමතිකව මහා සභා සම්මත විය. Xxxxxxxxxxx**

2022.12.09 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ **2022.11.11** වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව ස්ථිර කිරීම උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශීය සභාව,**
**කුරුවිට.**

02.සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන-

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා

ප්‍රදේශවාසි පුද්ගලයෙකු සභාවේ කාර්මික නිලධාරී මගින් යම් වැඩක් කරගන්න අමතලා.පාරක් සම්බන්ධයෙන්.රාජකාරි කටයුත්තක්.කාර්මික නිලධාරි සැරපරුෂ ලෙස උත්තර දීලා.ඒ පුද්ගලයා පොලීසියට පැමිනිලි කරලා.මේ සම්බන්ධව දැනුවත්ද?

අනිත් කාරනාව මේ අපේ සභාවේ අවසාන වාරයද දන්නෑ.මම නම් ආයෙත් බලාපොරොත්තුවක් නෑ එන්න. සමුදෙනවා.ගෞරවයෙන් හා අපරාජිතව.මගේ ඉල්ලීම.

අර සම්මන්ත්‍රනශාලාව ජනතා අයිතියට පවරා දෙන්න.එහි ඉහල මහලේ සම්මන්ත්‍රන ශාලාවේ මූලික කටයුතු නිමයි.මේ 45 ටම මම යෝජනා කරනවා මේ මාසය තුලම ඒ කටයුත්ත කරමු.උත්සව එපා.වියදම් එපා.ජනතා අයිතියට පවරා දෙන්න.විශේෂ ඉල්ලීමක්.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

පලමු කාරනාව.අපේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙක් සම්බන්ධ කාරනාවක්.මම දැනුවත්.කාර්මික නිලධාරි හමුවෙලා මුරුතකැටිය ප්‍රෙද්ශයේ සැලසුමක් අනුමත කරගන්න කීවාම මුදල් ඉල්ලුවා කියලා කීවා.තමන් අසීරුවෙන් ජීවත් වෙන බව කීවාම නිලධාරියාට කේන්තිගිහින් .තමන් ඉගෙන ගත්තේ වියදම්කරලා බව කිවාළු.සේවාව ලබා ගන්න ආව පුද්ගලයා පොලිසි ගිහින්.කාර්මික නිලධාරීත් පැමිනිල්ලක් දමලා.මේ කාල පරිච්චේදය තුලම නිලධාරියෙකු සම්බන්ධව පොලිසි ගිහින් නෑ.විසඳන්න බැළුවා.මේක සභාවෙන් සමතයක් කරගන්න කීවා.මම කාර්මික නිලධාරිට කතා කලෙත් නෑ.ඒක සමත කරන්න ඕ.අයි.සී.මහත්තයට කියලා.මේ සභාවට එන්නේ ප්‍රාදේශීය ජේකම් කාර්යාලයට යන විධිහට නෙමේ මිනිස්සු.තමන් ජන්දේ දිලා පත්කල මන්ත්‍රී ඉන්නවා.සාමාන්‍ය තැනකට වඩා හොඳින් ඒකටයුත්ත කරගන්න එන්නේ.නීත්‍යානුකූලව ඒ කටයුතු ඉෂ්ඨ කල යුතුයි.රාජකාරි කාලයේ .මේ දේ වෙලා තියෙන්නේ.මම මේ දේ ලේකම්ට විතරක් කිවා. පළාත් සභාවට කිව්වේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා

මෙවැනි දේවල් මීට පසු ආයේ කරගන්න එපා.ලේකම්තුමිය මේ ගැන බලන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

සමන්ත මහේෂ් මහත්තයා.ලිඛිතව මේ ගැන දීලා නැති උනාට මේ සම්බන්ධව මග අරින්න බෑ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා</u>**

මමත් කාර්මික නිලධාරි සම්බන්ධව වාර්තා කලා.වැසිකිලි ය සම්බන්ධව දැනුම්දුන් වෙලේ.මටත් දෝෂාරෝපනය කලා.නමුත් පරික්ෂනයක් කලේ නෑ. ජනතාව වෙනුවෙන් කතා කලේ.කනගාටුයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා</u>**

අපි දන්නෑ.ඇත්ත කියන්නේ කව්ද කියලා.එහෙම කිව්වට ඇත්තටම මුදල් ඉල්ලා නැත්නම්? මේක ගැටළුවක්.සල්ලි ගත්තද?දුන්නද?ඉල්ලුවද?දන්නේ නෑ.ගත්තා කියයි පැමිනිලිකරු.ඒක කලා නම් අල්ලස් එකට අල්ලාදෙන්න ඕනි.කාරනාව ඇත්ත නම් විනය පරික්ෂනයක්.යථාර්ථය මොකක්ද බලන්න.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**

මෙතැන ගතහැකි ක්‍රියාමාර්ග ගමු.අපිට කිව්ව පමනින් පිලිගන්න බෑ.පොලිසියෙන් ලිකිතව ගතහැකියි.ඉදිරියේදි ක්‍රියාමාර්ග ගමු.තාම මේක කාර්මික නිලධාරි අතින් අනාම කියලා නෑ.චෝදනා විතරයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිප්ති චන්දන මහතා</u>**

නිලධාරින් අතින් රාජකාරි ඉටුකිරීමෙදි කල නොහැකි දේත් කරන්න කියනවා.මේක අසත්‍යක් වෙන්නත් පුළුවන්.ප්‍රසිද්ධියේ මුදල ඉල්ලුවාද දන්නෑ.හෙට යන අය නෙවේ. අපි සභාවෙන් ඉවත් උනත් නිලධාරින් විශ්‍රාම ගන්න අය.රැකගත යුතුයි.මේ චෝදනා ඇත්තද කියලා බලන්න.ඔබතුමා ගාවටයි එන්න තිබ්බේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා</u>**

අපි ජනතාව වෙනුවෙන් ආවේ.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**

සම්මන්ත්‍රන ශාලාව ජනතාවට පරිහරනයට දෙන්න කීවා.මේක මේ දෙසැම්බර් 25 ට පෙර විවෘත කරනවා.මහජන පරිහරනයට.ජානක වක්කුඹුර ඇමති තුමා මග පෙන්වුවා ඉතිරි වැඩ කොටස කරන්න නයක් ගන්න.දේශීය නය සංවර්ධන අරමුදලෙන්.මේ කටයුත්ත සාර්ථක කරගමු.සභාවෙන් දිනයක් තීන්දු කරන් කරමු.23 වගේ බැරිද? මේ කටයුත්ත ක්‍රමවත්ව කරමු.කමිටුවක් හදාගමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා</u>**

දේශපාලනය එපා.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

විෂය භාර ඇමතිතුමා ට ආරාධනා කරමු.මහා ආන්ඩුවේ පළාත්සභාවේ ආරාධනා කල යුතුයි. අපි නැතත් මේ සභාවට ඉදිරියක් තිබිය යුතුයි.ගරු ආණ්ඩුකාර තුම,රංජිත් බණ්ඩාර ඇමතිතුමා,හිටපු ඇමතිතුමිය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා</u>

දෙපැත්තමෙ අය ගෙන්වන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා</u>

අපි කැමතියි.23 හරි කරමු.කරන සැලැස්ම ඉදිරිපත්කරන්න.

03.සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිනිලි -නොමැත.

04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් ජයරත්න මහතා විසින් ඉදිරිපත්කර ඇති ප්‍රශ්න</u>

04-01. 2022.01.01 දින වන විට මෙම සභාවට අයවිය යුතු හිඟ බදු මුදල් ප්‍රමාණය රු.10072169.52කි.මෙ වන විට එම මුදලින් අය වී ඇති මුදල රු.1270090.65 කි. ඒ අනුව අයවිමට ඇති මුදල හිඟ මුදල රු.8802078.87 කි.මෙම වර්ෂය අවසන් වන විට මෙම හිඟ මුදල දෙගුනයකට ආසන්න වේ.එබැවින්,

1.මෙම හිඟ මුදල් අයකරගැනීමට ගෙන ඇති පියවර කුමක්ද?

2.එම පියවර මගින් ලබා ඇති ප්‍රගතිය කුමක්ද?

3.සත්‍ය ලෙසම අයකරගත නොහැකි වූ බදු කරුවන් හඳුනාගෙන ඇත්ද?ඔවුන් පිලිබඳ ගෙන ඇති පියවර කුමක්ද?

4.බදු පැහැර හරින පුද්ගලයන් පිලිබඳව නීතිමය පියවර ගෙන තිබේද?එහි ප්‍රගතිය කුමක්ද?

5.බදු පැහැර ඇති ලේඛනයේ පැරණිම බදුකරු කවුද?ඔහු බදු පැහැරහැර ඇත්තේ කුමන වර්ෂයේ සිටද?

6. මේවන විට කුරුවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජී.අයි.එස්. තාක්ෂනය යටතේ සිතියම්ගත කිරීම සඳහා හඳුනාගෙන ඇති මාර්ග සංඛ්‍යාව කොපමනද?

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

මෙම ප්‍රශ්න සියල්ල සඳහා පිලිතුරු වාර්තාව සභාගත කරමි.බදු සම්බන්ධ සියළු තොරතුරු ඇමුනුම් 1 මගින් දක්වා ඇති අතර ගරු මන්ත්‍රිතුමන්ලාගේ අවධානයට මෙම සභාවාර්තාව සමග ද මෙම විස්තර වාර්තාව ලබාදෙමි.(ගරු සභාපතිතුමා විසින් වාර්තාව කියවන ලදි.) ඒ සඳහා පියවර ගන්න. මේවන විට කුරුවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජී.අයි.එස්. තාක්ෂනය යටතේ සිතියම්ගත කිරීම සඳහා හඳුනාගෙන ඇති මාර්ග සංඛ්‍යාව 689 පමන වේ. මේ මාර්ග අපි තනියම සිතියම් ගත කලොත් විශාල මුදලක් යයි.මේ මාර්ග අයත් කොට්ඨාශ මන්ත්‍රිතුමන්ලා ගෙන්වලා හැකි උනොත් කතා කරමු. ඒ මාර්ගවල ප්‍රමාන පලල ගැන.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

**සභා විසුරුවලා මාර්තු 30 පුළුවන් අළුතෙන් සභා පිහිටුවන්න. පරන ක්‍රමයට ජන්දය තියන එකයි සුදුසු.විශාල නඩත්තු මුදලක් යනවා.මේක ඔරොත්තු දෙන්නෑ.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි නයනා ජීවනි මිය.

**මේ ආර්ථිකය එක්ක ජනතාව දැඩි පිඩනයෙන්.හැකිනම් ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය අරන් පොත් ටිකක් දෙමු දරුවන්ට.අන්තිම සභාවේ මේ කියන්නේ කොහොම හරි අනුමැතිය අරන් පොත් ටිකක් දෙමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

**කොමසාරිස් අනුමැතිය අරන් දෙන්න පුළුවන්.**

## 05.යථා පරිදි කල්දී ඇති යෝජනා :-

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**05-01.** මෙනේරිපිටිය වසමේ බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉහල මහලේ කණු කොන්ක්‍රිට් කර ඉදිකිරීමේ යෝජනාව.( රු.400000.00)

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**මෙනේරිපිටිය වසමේ බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉහල මහලේ කණු කොන්ක්‍රිට් කර ඉදිකිරීමට යෝජනා කරමි.මෙම යෝජනාවට ඇස්තමේන්තු මුදල රු.400000.00 ක් ලෙස සඳහන් කලද එම මුදල ප්‍රමානවත් නොවන අතර එය රු3000000.00 ලෙස සංශෝධනය විය යුතුය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**මෙම ගොඩනැගිල්ලේ කාර්යාල 5ක් තියෙනවා.තවත් ඉදිරියේදි කාර්යාල මෙම ස්ථානයේ දැම්මට නියමිතයි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා**

**ගිය සභාවේ මම යෝජනා කලා වටප්පිටිය සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නිල නිවාසයේ නිශ්කාර්යව ඇති වතුර මෝටරය හෝමියෝපති ස්ථානයට දෙන්න කියලා.ඒ මෝටරය 2015 වසරේ සභාවෙන් දිපු එකක්.ඒක නිශ්කාර්යයි.නිල නිවාසයේ කුස්සියේ විමිනිය යට තියෙනවා.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**ඒ සම්බන්ධව නිලධාරින්ට දැනුම් දුන්නා.නීත්‍යානුකුලව ලබා දිය යුතුයි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**මේ බහුකාර්ය ගොඩනැගිල්ල කියන්නේ සේවා පියසක් නොවෙයි.ප්‍රාෙේශීය සෞඛ්‍ය මධ්‍යස්ථානය හෝමියෝපති ආදි සේවාත් මෙහි තියෙනවා. සේවා පියස ප්‍රාලේ යටතේ තියෙන්නේ.විවිධ පළාත් පාලන ආයතන වලට ගොඩ එන්න දෙන්නේ නැත්තේ නිලධාරින්.මිනිස් අවශ්‍යතා වෙනුවෙන් මහජන සේවා ලබා දීමේදි තිරිංග දානවා.රට සංවර්ධනයට මේ දෙපිරිස එක් විය යුතුයි.ඒ සඳහා පෙල ගැසෙමු.එල්ලාවල බල ප්‍රෙද්ශයේ කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් බහුකාර්ය ගොඩනැගිල්ලේ එල්ලාවලග්‍රාමසේවක රැඳි සිටිනවා.මෙම ස්ථානය සංවර්ධනය කල යුතුයි.මෙය සභාවට අයත් දේපොලක්. නමුත් මෙතුමා යන්න කැමති නෑ.එල්ලාවල ප්‍රජා මණ්ඩලයේ එතුමාගේ කාර්යාලය පවත්වාගෙන යන්න පුළුවන්.නමුත් මෙතුමා කැමති නෑ.අපි යන්න පෙර සභාදේපල නිරවුල් කර ගත යුතුයි.සභාවේ අවශ්‍යතා වලට මිස පිට දේවලට මේ ස්ථාන දෙන්න එපා.අපි සභාවේ දේ වෙනුවෙන් පෙනිසිට බැනුම් අහලා තියෙනවා.මෙතන සංස්කෘතික මධ්‍යස්ථානය විතරක් නෙවෙයි.මහජන පුස්ථකාලයත් වැදගත්.සුසාන භූමි සභාවට පවරාගත යුතුව තියෙනවා. නමුත් පවරා ගන්න ගියාම ගැටළු.දේශපාලකයන් රුකඩ විය යුතුනෑ.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**අපි ප්‍රාදේශීය ලේකම් එක්ක කතා කරලා මේ ග්‍රාමනිලධාරීගේ කාර්යාලය එම ස්ථානයෙන් ඉවත්කරමු.වෙන තැනක් දිලා හරි එම ස්ථානය නිරවුල් විය යුතුයි.මට එදා යන්න බැරි උනා.මේ ගැන ප්‍රාදේශීය ලේකම් ,දිස්ත්‍රික් ලේකම් ,පළාත් පාලන කොමසාරිස්ට,ගරු ආණ්ඩුකාර තුමාට දන්වන්න.උප සභාපතිතුමා කියන පරිදි මේ කටයුත්ත කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** ගරු සභාපති ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**ගේ යෝජනාව අනුව මෙනේරිපිටිය වසමේ බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉහල මහලේ කණු කොන්ක්‍රිට් කර ඉදිකිරීමට රු රු3000000.00 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

<u>2022.12.09 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 5-02 යටතේ වන සභා තීරනයේ උද්‍යතය</u>

**05-02.**කුරුවිට නගරයේ මහජන වැසිකිලිය ප්‍රතිසංස්කරනය කිරීම සඳහා සභා අරමුදලින් රු.**5000000.00** ක් දැරිම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

කුරුවිට නගරයේ මහජන වැසිකිලිය ප්‍රතිසංස්කරනය කිරීම සඳහා සභා අරමුදලින් රු.**5000000.00** ක් දැරිම සඳහා මහා සභා අනුමැතිය ලබාදිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**වැසිකිලිය සම්බන්ධව අපිට මෙතෙක් කටයුතු කල නොහැකි උනා.දැන් හෝ මේ සභා අරමුදලක් දාලා, තියෙන මුදලින් කරමු.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා</u>

**මේ වැසිකිලිය හදන වැඩේ ඉවරයක් නෑ.මේ වැඩය පිලිවෙලකට වෙන්නේ නෑ.ලක්ෂ පනහ මුදල වැඩියි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා</u>

**<u>මේ</u> වැසිකිලිය ඒකාලේ සෙනරත් අප්පෝ සභාපති කාලේ කලේ. ඒකාලේ ලක්ෂ 15 විතර.ඒ මුදල වැඩියි කියලා කීවේ.දෙවන වරත් ලක්ෂ ගානක් ගියා.ඇත්තටම මේකට ලක්ෂ 50ක් දානඑක සුදුසු නෑ.සභාප්‍රෙද්ශයේ එකතුවෙන බදු මුදලින් වැඩිම වැයකිරිම් කලේ කුරුවිට නගරෙට.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**මේක පොදුවේ සබාව.කුරුවිට,කිරිඇල්ල කියලා වෙනසක් නෑ.උපරිම ගන්න පුළුවන් මුදලක් අරන් මේ ප්‍රධාන නගරයේ වැසිකිලිය නවිකරනය කරමු.නමුත් විරුද්ධ නම් අනවශ්‍යයි.මේ වැසිකිලිය බොහෝ තැන් වලින් ඉල්ලුවා හදලා දෙන්න කියලා.ගරු ආන්ඩුකාරතුමට,පළාත් පාලන අමාත්‍යංශ ලේකම්ට,වාසු ඇමතිතුමාට කීවා. බැරිඋනා.රජයෙන් මුදල් දෙයි කියලා හිතුවට බැරිඋනා.ඩිලාන් මන්ත්‍රිතුමා වැඩේ කර දෙන්න උත්සහ කලත් බැරි උනා.අවසරයක් ගතහැකි වෙලාවේ මේ වැඩේ කරන්න හැදුවේ.එහෙනම් අවශ්‍ය නෑ.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා</u>

**විරුද්ධ බව නෙමේ කීවේ .ඔය මුදල දාලා කරන්න තරම් දෙයක් එතන නෑ.ගාන වැඩියි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා</u>

මේක හදන්න ඕනි. සිරිපාදේ පටන්ගත්තා.හිටපු ජනතාවට යන්න වැසිකිලි නෑ.ලැජ්ජයි. අවසානයෙදි හරි හදමු. කුරුවිට ගොඩනැගිලි වලත් වැසිකිලි නෑ.මේක නොකලොත් නගරේ යන්න වෙන්නේ හැංගිලා.දැන් ද්‍රව්‍ය මිල ඉහලයි.කතරගම තියෙනවා ක්‍රමවත් වැසිකිලි පද්ධතියක්.සෙල්ල කතරගම.තාක්ෂනය අතින් ඉහලයි. 10කට විතර එකවර යන්න පුළුවන්. මේක විය යුතු වැඩක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා

මුදල වැඩි බවයි කිව්වේ. මේ වැසිකිලි ප්‍රශ්නය ජනතා ප්‍රශනයක්. කිරිඇල්ලෙත් මේ ප්‍රශ්නය දැඩි ගැටළුවක්.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

ඇස්තමේන්තු හදලයි මේ වැඩේ කරන්නේ. නමුත් අකැමැති නම් ගැටළුවක් නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා

මේ වැසිකිලිය ගැටළුවක්.ආන්ඩුකාරතුමාවත් , වාසු ඇමතිතුමාවත් කලේ නෑ.බලය තියෙන කාලේ.හයිඩ්‍රාමනිය එක්කවත් කතා කරන්නයි හිටියේ.ඇස්තමේන්තු හදලා

අද හෝ ගිහින් විස්තර බලමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

මමත් කාලයක්ම ඉල්ලුවා මේ වැසිකිලිය රෙපෙයාර් කරන්න.ලිඛතව ඉල්ලුවා.ඒකාලේ මිල අඩුයි.අඩුපාඩු ටික දාලා හදන්න. දෙන්න කිව්වට දුන්නෑ.දැන් ඒ මුදලට බෑ.ජනතාව වැසිකිලියට යන ආකාරය කතගාටුදායකයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

වැසිකිලිය අත්‍යාවශ්‍යයි.මෙපමන කලක් උත්සහ කලත් බැරි උනා.මේක නොකලොත් ඇත්තටම අගෞරවයක්.දැන් මේ සංවර්ධන වැඩ වලට මුදල් දෙන්නේ නැත්නම් කර්මාන්තපුරේ තියෙන ආයතනවලින් හරි ආධාර අරන් කාර්මික කමිටුවට මේක භාර දිලා සිරිපා වන්දනා සමයේ හරි යන පිරිසට යාහැකි ලෙස පරිහරනය කල හැකි ලෙස හදමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා

කිරිඇල්ලේ අපිටත් අගෞරවයක්.ඒ ජනතාවගෙන්.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

කුරුවිට පොදු වැසිකිලිය යන්න හැකි ලෙස හදන්න.අපි ගෙවල්වල කොහොමද වැසිකිලි තියා ගන්නේ.ගඳ ගහනවද? උතුරනවද?නෑ. නුවර එලියේ, කතරගම ඇයි ඒ වැසිකිලි එහෙම නැත්තේ.ඒවා නඩත්තු කරනවා.සේවකයෝ සල්ලි ගන්නෑ.ඒ උනාට නිසි ලෙස නඩත්තු කටයුතු කරනවා.ඕනි කෙනෙකුට යන්න පුළුවන්.කාන්තාවක් හිටියා මේ වැසිකිලියේ පරුෂ වචන කියනවා.ඉතා පහත්. වැසිකිලි නඩත්තුව නිසි ලෙස කෙරෙන්න ඕනි.නිල ඇඳුමක් ඇදල හරියට කරන්න ඕනි.යුඩි එකේ එහෙමයි.අද වැසිකිලි සභා පාලනයෙන් මිදිලා.මුදල් විතරයි.

පසුව්පරම නෑ.මේවා අධීක්ෂනය කරන්න. අදාල නිලධාරින් මේවා අධීක්ෂනය කරන්න. මහජන සේවා මේවයි අවශ්‍යා.මේ කටයුත්තට භේද වෙන්න එපා.තලාවිටියෙත් වැසිකිලිය හැදිය යුතුයි. කිරිඇල්ලත් එහෙමයි.කුරුවිට වැසිකිලියට දල ඇස්තමේන්තුවක් නිත්‍යානුකූලව හදමු.ඇස්තමේන්තුව සභාවේ අනුමත කරලා පුද්ගලිකව දෙන අනුග්‍රහයනුත් ගමු.

ජයරත්න මන්ත්‍රිතුමා කීවා වගේ සල්ලි පොම්ප කලා විතරයි.පලක් නෑ.හැම වෙලේම තුවාලේ වගේ.ටැප් කැඩෙනවා.විදුලිය ගැටළු. මේ හැමදේම අධීක්ෂනය කරන්න ක්‍රමවේද හදන්න. දැනුවත් කරන්න.ජනතාව වෙනුවෙන් කරන දේවල් ඇයි අධීක්ෂනය නොකරනේන්?.චක්‍ර ලේඛන වලට යටත්ව හදන්න.අපි මේ කටයුත්ත ප්‍රමාද කලේ එක එක කෙනා කරයි කියලා.එදා කලා නම් එතරම් මුදල් වැය වෙන්නෑ.මේක මූලික අවශ්‍යතාවක්. ඒ නිසා මේ වැසිකිලිය හදන්න අනුමැතිය දෙමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>

මේ වැසිකිලිය ගැන කාලයක් පුරා කතා කලා.මේ වැසිකිලි වල ගැටළු වලට සියළු දෙනා වගකිව යුතුළු.අපිව අතහරින්න.බුරුවගේ වැඩේ බල්ලා කරන්න එපාළු.මේකේ කතා කරන්නේ බල්ලා බූරුවා කියලා.ප්‍රතිපාදන යෙදලා වැඩේ කරමු.ඇඹිල්ල දිගු කරන්න එපා.කෙසේ නමුත් මේ වැසිකිලිය හදන්න.අපිට ලැජ්ජයි.විදුලියත් නෑ. අපි මේවායින් මගඅරින්නෑ.අපි යෝජනා ස්ථිර කලා.සහාය වෙනවා.කුරුවිට නගරය ලස්සනට තිබිය යු.තුයි.මේක ලක්ෂ දෙකකින් වගේ පුළුවන් කියලා ශානක මන්ත්‍රී තුමා කීවා.හැකිනම් කරවන්න.ලක්ෂ 50ක් යන්නෑළු.ඉතින් ලක්ෂ දෙකෙන් කරන්න දේන්න.එතුමට.ලක්ෂ 48 ක් ම ලාභයි.මංගල මන්ත්‍රිතුමා මූලිකත්වයෙන් සෝමරත්න මන්ත්‍රිතුමා සහාය වෙයි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>
සෝමරත්න මන්ත්‍රිතුමා මාත් එක්ක රන්ඩුත් උනා.මේ වැසිකිලිය නිසා.පරකඩුව පොල හදන්නත් තිබුනා.ශානක මන්ත්‍රිතුමා කිරිඇල්ල ගැන කියනවා.නමුත් අර හදපු ගොඩනැගිල්ල ගැන කියන්නෑ.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා</u>

1997 සිට ජනතාව මාව මේ සභාවට පත්කලා.ජාතික හා කොට්ඨාශ කුමය අනුව.මම මට හැකි උපරිමයෙන් කටයුතු කලා.මම නැවත ඡන්දය ඉල්ලීමට බලාපොරොත්තු වෙන් නෑ.මම හිතන්නේ මගේ කාර්ය භාරය නිමයි.මම

සභාපතිවරු 4ක් එක්ක කටයුතු කලා.එජාප සභාපති සමගත් වැඩ කලා.ගැටුම් නෑ.මම සභාවේ නිසිපරිදි කටයුතු කලා.හරියට වැඩකලා.අවශ්‍ය තැන කතා කලා.වෙලාවට වැඩකලා.බය නෑ.තර්ජන ගර්ජන වලට මම බය නෑ.මම අවංක දේශපාලකයෙක් උනා.නගරයේ අංග සම්පූර්න වැසිකිලියක් කියන්නේ මගේ සිහිනය. නමුත් මේ මට යන්න නෙවේ.

මිනිස්සු, සංචාරකයින් ආවාම යන්න තැනක් නෑ. මට ලැජ්ජයි.1994 ඉඳන් මම පෙරමුනේ.මැනික් ගලක් අරන් මම ජීවත්වුනේ.ගසාකාලා නෑ.මහජන දේපොල කැවේ නෑ.කුරුවිට නගරෙට මේ පහසුකම් සපයන එක ලොකු සේවාවක්. පරලොවට කුසලයක්.කකුලෙන් අදින්න එපා.කිරිඇල්ල සංවර්ධනය වෙන්න ඕනි.ඒක කරන්න ලක්ෂ දෙකකින් බෑ. වැසිකිලි පෝච්චි දෙකක්ම කීයක් වෙනවද? හිරිකිතයි.ඒ පලාතේ යන්න බෑ.මම දැඩි ඉල්ලීම.කුරුවිට නගරයේ තවත් ගඳ නොගස්සා වැසිකිලිය හදන්න.මේක ජනතා ඉල්ලීම. මේකට අකැමැති අය මතය විමසලා බලමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා</u>

අපි මේ ගැන ආදාඉඳන්ම කතා කලා.අන්තිම මොහොතේ හරි කරන එක හොඳයි.ලක්ෂ 50 වැඩිගානක් උනත් හැදිය යුතුයි.විවේකයේ නගරය ගොඩනැගිය යුතුයි.හැබැයි තියෙන තැන අළුතෙන් හදමු.විශාල වියදමක් යයි. ඒත් අළුතෙන් හදමු.අනිත් තැන් වලටත් වැසිකිලි ඕනි.නමුත් ප්‍රමුඛතාවය කුරුවිටට.මේ කටයුත්ත විනිවිදව කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඹී නයනා ජීවනි මිය.</u>

ගිය සභාවෙත් මේ ගැන කතා කලා.සතුටුයි. මේ වැසිකිලිය මේ කාලේවත් හදන එක ගැන.කාන්තාවන්ට ලැජ්ජා බය ඇතිව යන්න විධිහක් නෑ.දොාරවල් නෑ. ටැප් කඩලා.වතුර ගහන්න බෑ.අළුත්වැඩියා වැඩක් නෑ.අළුතෙන් හදන්න.ලබන සැරේ අපේ ආණ්ඩුවක් වෙන්නත් පුළුවන්.අනික මේ වැසිකිලි වැඩිහිටියන්ට විතරක් නෙමේ.දරුවන්ටත් යාහැකි ලෙස හදන්න. ගෑනු පිරිමි දරුවන්ට වෙනම.ලොකු කොමඩ් වල හෙම දරුවන්ට යන්න බෑ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

පොදු වැසිකිලිවල සාමාන්‍යයන් කොමඩ් නෑ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා</u>

දැවැන්ත ප්‍රශ්නයක්.වැසිකිලියි වතුරයි ගැටළු.අර මෝටරය ගේන්න.මේ නගරේට පිටින් ජනතාව වැඩිපුරම රැස්වෙනවා.වැසිකිලි පහහසුකම්,වතුර නෑ කියන්නේ බරපතල අඩුපාඩුවක්.සෙනසුරාදට වැඩියි.විකසිත මන්ත්‍රීතුමා කීවා වගේ .පරන එක ප්‍රතිසංස්කරනය කරන්න.නමුත් අළුතෙන් වැසිකිලියක් හදන්න.පොදු ජනතාවට අංග උපාංග ඇතිව නව වැසිකිලියක් හදන්න.තියෙන එකේ ඉඩ ප්‍රමානයත් මදි.වට්ටාරම තියෙන වැසිකිලියත් හොඳ ආර්ශයක් ගතහැකි වැසිකිලියක්.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

මේ යෝජනාව දුර ගියා.මේ ගැටළුව ලක්ෂ 50 ක් විතර යන එක. පළාත් සභා ඉංජිනේරු,මගින් විනිවිදව මේ කටයුතු සිදු කරන්නේ.නයනා මන්ත්‍රීතුමිය කියන විධිහට

**ලමයින්ටත් වෙනම ඕනි.ආබාධිත අයටත් ඕනි.ඒ වගේම කිරිඇල්ලේ ගොඩනැගිල්ලට හැදුවා වැසිකිලියක්.ඒකත් භාවිත කල හැකියි.මේ කටයුතු කිරිමට නියමිත සභා අරමුදලේ ස්ථාවර තැම්පතුවෙන්.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා

**වෙළඳ සංකීර්නයේ එක නෙවෙයි.අපේ පැරණි වැසිකිලිය ඒක ප්‍රතිසංස්කරනය කරන්න.අර වැසිකිලියට දුර යන්න වෙනවා.අපහසුයි. මේ තරම් කියන්නේ ජනතාවගේ ඇඩි ගැටළුවක් නිසයි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.කේ.එම්.එස්.එස්.ධනවර්දන මහතා

**ගොඩනැගිල්ලට වැසිකිලියක් තියෙන එක වටිනවා. නගරේ වැසිකිලියත් ප්‍රතිසංස්කරනය කිරිම ජනතාවට ලොකු පහසුවක්.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා

**අපි ටවුමට යමු.අද.කාර්මික නිලදාරි ,සෝමරත්න මන්ත්‍රීතුමා, මංගල මන්ත්‍රීතුමා,දේවින්ද මන්ත්‍රීතුමා,මහින්ද මන්ත්‍රීතුමත් එක්කර ගන්න.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**පළාත් සභා ඉංජිනේරු මගින් මේ කටයුතු කරවමු.එසේම මෙම සියළු කරුණු සලකා බලා කුරුවිට නගරයේ මහජන වැසිකිලිය ප්‍රතිසංස්කරනය කිරීම සඳහා සභා අරමුදලේ ස්ථාවර තැම්පතුවෙන් රු.5000000.00 ක් දැරිම හෝ නව වැසිකිලියක් ඉදිකිරිම සම්බන්ධව පළාත් සභා ඉංජිනේරු වරයාගේ උපදෙස් ගෙන ඒ අනුව ඉදිරි කටයුතු කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතාගේ යෝජනාව අනුව කුරුවිට නගරයේ මහජන වැසිකිලිය ප්‍රතිසංස්කරනය කිරීම සඳහා සභා අරමුදලේ ස්ථාවර තැම්පතුවෙන් රු.5000000.00 ක් දැරිම හෝ නව වැසිකිලියක් ඉදිකිරිම සම්බන්ධව පළාත් සභා ඉංජිනේරු වරයාගේ උපදෙස් ගෙන ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.12.09 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 5-02 යටතේ වන සභා තීරනයේ සත්‍ය උද්‍ධෘතයක් බව සහතික කරමි.

එස්.එච්.ආර්.වීරක්කොඩි,
ලේකම්, ප්‍රාදේශිය සභාව,
කුරුවිට.

**05-03.**මෙනේරිපිටිය වසමේ සියළු මාර්ග මැනීම් කටයුතු සිදු කර සභාවට පවරා ගැනීමේ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

මෙනේරිපිටිය වසමේ සියළු මාර්ග මැනීම් කටයුතු සිදු කර සභාවට පවරා ගැනීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

මෙනේරිපිටිය වසමේ සියළු මාර්ග මැනීම් කටයුතු සිදුකර පවරාගෙන නිත්‍යානුකූල කල යුතුයි. ප්‍රධාන වශයෙන්

**1.**මෙනේරිපිටිය අළුපොත මාර්ගය අඩි **22** ක් පළලට මැන සභාවට පවරා ගැනීම.

(කොළඹ රත්නපුර ප්‍රධාන පාරින් ආරම්භ වී මෙනේරිපිටිය පන්සල අසලින් කන්දෙ කඩේ දක්වා මාර්ගය)

**2.**තිරිවාන පන්සල පාර අඩි **15** ක් පලලට මැන සභාවට පවරා ගැනීම.

(තිරිවාන හන්දියේ සිට මෙනේරිපිටිය පන්සල දක්වා මාර්ගය )

**3.**මෙනේරිපිටිය මැල්වත්ත මාර්ගය අඩි **18** ක් පලලට මැන සභාවට පවරා ගැනීම.

(මෙනේරිපිටිය බහුකාර්ය ගොඩනැගිල්ල අසල සිට පරකඩුව දිගෝව මාර්ගය දක්වා)

**4.**ගලහිටිය මිගස්තැන්න මාර්ගය

කොළඹ රත්නපුර මාර්ගයේ ගලහිටිය අසලින් ආරම්භ වි පරකඩුව දිගෝව මාර්ගය දක්වා.)

යන මාර්ග සම්බන්ධයෙන් කඩිනම් පියවර ගන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**_ගරු සභාපති <u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**ගේ යෝජනාව අනුව මෙනේරිපිටිය වසමේ ඉහත විස්තර සඳහන් පරිදි එම මාර්ග හා වසමේ සියළු මාර්ග මැනීම් කටයුතු සිදු කර සභාවට පවරා ගැනීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.</u>**

**05- 04. නඩුකාරදෙනිය වසමේ වොලිබෝල් ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරනය කිරීමේ යෝජනාව.**
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**

**නඩුකාරදෙනිය වසමේ වොලිබෝල් ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරනය කිරීමට යෝජනා කරමි.**
**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>**
එම යෝජනාව ස්ථිර කරමි.
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**
**මේ පිටියේ භාන්ඩ දැමීමට මඩුවක් සකසා තියෙනවා.ද්‍රව්‍ය දාන්න.බාගෙට හදලා.ඒකේ වහලේ හදන්න ද්‍රව්‍ය ආධාර ඉල්ලන්නේ.**
**ගරු සභාපති <u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**
**ප්‍රතිපාදන ලැබෙන අයුරින් කටයුතුකරමු.කාර්මික නිලධාරිවාර්තාගමු.**
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx<u> ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතාගේ යෝජනාව අනුව</u>**
**නඩුකාරදෙනිය වසමේ වොලිබෝල් ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරනය කිරීමට කාර්මික නිලධාරිවාර්තා රැගෙන ද්‍රව්‍යමය ආධාර ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-05.මිල්ලගස්තැන්න තුංදොල ගොවිපල පාර කොන්ක්‍රිට් කිරීමේ යෝජනාව.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**
**මෙම නමේ සංශෝදනයක් තියෙනවා. තිඹිරිගස්හේන තුන්දොල මාර්ගය ලෙස.ඒ අනුව තිඹිරිගස්හේන තුන්දොල මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.**
**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>**
එම යෝජනාව ස්ථිර කරමි.
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**
**මෙම මාර්ගය සංවර්ධනය කල යුතු අත්‍යවශ්‍ය මාර්ගයක්.**
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතාගේ යෝජනාව අනුව</u>**
**තිඹිරිගස්හේන තුන්දොල මාර්ගය කොන්ක්‍රීට් කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-06.පරගලතැන්න මාර්ගයේ ගමන් කිරිමට ඇති අපහසුතාවය මගහරවා ගැනීම සඳහා ප්‍රිමික්ස් කියුබ්දෙකක් ලබාගැනීමේ යෝජනාව.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**
පරගලතැන්න මාර්ගයේ ගමන් කිරිමට ඇති අපහසුතාවය මගහරවා ගැනීම සඳහා ප්‍රිමික්ස් කියුබ්දෙකක් ලබාදීමට යෝජනා කරමි.
**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>**
එම යෝජනාව ස්ථිර කරමි.
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**
**අධික වර්ෂා ජලය ගලා යාම හේතුවෙන් මේ මාර්ගය කඩාගෙන ගිහින්.මේ මාර්ගය කඩිනමින් පිලිසකර කල යුතුයි. ගමනාගමනය අපහසුයි.**
**ගරු සභාපති <u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**
**කාර්මික නිලධාරි වාර්තාගෙන ඉදිරි කටයුතු කරමු.**
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.
**Xxxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතාගේ යෝජනාව අනුව</u>**
පරගලතැන්න මාර්ගයේ ගමන් කිරිමට ඇති අපහසුතාවය මගහරවා ගැනීම සඳහා පිලිසකර කිරිමට ප්‍රිමික්ස් කියුබ්දෙකක් ලබා දීම සඳහා කාර්මික නිලධාරි වාර්තාගෙන කටයුතු කිරීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.</u>**

05-07. කොස්ගොඩ ප්‍රජා ශාලාවට යන පාර 11 අඩියර කොන්ක්‍රිට් කිරිමේ යෝජනාව.(රු.200000.00)

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා</u>**

කොස්ගොඩ ප්‍රජා ශාලාවට යන පාර 11 අඩියර කොන්ක්‍රිට් කිරිමට රු. රු.200000.00 ක ප්‍රතිපාදන ලබාදෙන ලෙස යෝජනා කරමි.
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා</u>**
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.
**Xxxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතාගේ යෝජනාව අනුව</u>**

කොස්ගොඩ ප්‍රජා ශාලාවට යන පාර 11 අඩියර කොන්ක්‍රිට් කිරිමට රු. රු.200000.00 ක ප්‍රතිපාදන ලබාදීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-08.පැරඩයිස් නව ජනපදය ප්‍රජා ශාලාවට යන පාර 11 අඩියර කොන්ක්‍රිට් කිරිමේ යෝජනාව. (රු.200000.00)
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා
පැරඩයිස් නව ජනපදය ප්‍රජා ශාලාවට යන පාර 11 අඩියර කොන්ක්‍රිට් කිරිම සඳහා රු. රු.200000.00 ක ප්‍රතිපාදන ලබාදෙන ලෙස යෝජනා කරමි.මෙය මිටර් 60ක් සඳහා ලෙස ඇතුලත්විය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.
**Xxxxxxxxxxxxxxx** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතාගේ යෝජනාව අනුව
පැරඩයිස් නව ජනපදය ප්‍රජා ශාලාවට යන පාර 11 අඩියර මිටර් 60 ක් කොන්ක්‍රිට් කිරිම සඳහා රු. රු.200000.00 ක ප්‍රතිපාදන ලබාදීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-09. කුරුවිට නගර මධ්‍යයේ ඇති ජල ටැංකිය යට ස්ථානය ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා කුරුවිට ග්‍රාමනිලධාරි වසමේ සමෘර්ධි ප්‍රතිලාභීන් කීප දෙනෙක් වෙත මාසික කුලි පදනම යටතේ ලබාදීම සම්බන්ධ යෝජනාව.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා

කුරුවිට නගර මධ්‍යයේ ඇති ජල ටැංකිය යට ස්ථානය ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා කුරුවිට ග්‍රාමනිලධාරි වසමේ සමෘර්ධි ප්‍රතිලාභීන් කීප දෙනෙක් වෙත මාසික කුලී පදනම යටතේ ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා
එම යෝජනාව ස්ථිර කරමි.
සංශෝධනයක් කරනවා.කුරුවිට ග්‍රාමනිලධාරි වසමේ සමෘර්ධි ප්‍රතිලාභීන් කීප දෙනෙක් සඳහා නොව කුරුවිට බල ප්‍රදේශයේ ජනතාවට අයිත් දෙයක්.ඒ නිසා පොදුවේ දෙන්න.මේක සභාවේ බූදලයක්.අපේ ගම්වලටත් ඕනි.ජනතාවට. මෙම ස්ථානය රජයේ පොදු ස්ථානයක්.
**සභාව මෙහෙයවීමේ බලය ඇත්තේ ගරු සභාපතිතුමාට. දේවින්ද මන්ත්‍රිට නොවේ.**

**මේ අවස්ථාවේ සභාවේ දැඩි ගෝෂා පැවතුණි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

සමෘර්ධි මහබැංකු සංවිධාන එකතුවක් ලෙස කරන්න.ඒ අයටත් කල හැකි ලෙස ක්‍රමවේදයක් හදන්න.මහජන බදු මුදලින් ඉදිකරලා තියෙන දුම්රිය නැවතුම්පල ගොඩනැගිල්ලත් කිසි ජනතා සේවයක් නැතිව තියෙනවා.මහා ප්‍රාග් ධනයක් .හදලා තියෙන ස්ථානය ජනතා සේවයට එකතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා
රුවන් මන්ත්‍රීතුමාගේ යෝජනාවට මම විරුද්ධ නෑ.මම මීට පෙර සභා කීපයකම කතා කලා මේ ස්ථානයේ පෙරේරා ඇන්ඩ් සන්ස් වගේ ව්‍යාපාරික ස්ථානයක් පවත්වමු කියලා.ඒ මොඩල් එකට.ජුස් එකක් තේ එකක් හරියට බොන්න තැනක් නෑ.ගිය සභාවෙත් කිවා.ඒකට ගැලපෙන කෙනෙක් හොයලා දෙනවා කීවා.සංදේශ ඉදිරිපත්කරපු වෙලේ කතා කලේ නෑ මේ ගැන.කලකට පෙර ඉල්ලූ කෙනෙක් හිටියා නම් ඒ අයට දෙනවා නම් අද දක්වා බදු ගෙවන්න ඕනි හිඟ.ඒ පුද්ගලයා ඉල්ලූ නිසා දෙන්න බෑ කීවේ.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

සභාවේ අනුමැතියක් තියෙනවා.ලිපියක් ගහන්න.නමුත් මෙතෙක් ඒ ස්ථානය භාර අරගෙනත් නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා
විකල්ප කීවා.වෙන අයෙකුට දෙමු කීවා.
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

යෝජනා දාලා නෑ.යම් ක්‍රමවේදයකට කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

විවේකයේ නගරය උනාට ලක්ෂ ගානක් යනවා එනවා උනාට පාකිං නෑ.බෙහෝ අඩුපාඩු.සමෘර්ධි බලකාය කරනවා නම් පොඩි දේවල්නේ.වාහන නවත්තන්න හැකි ලෙස සංවර්ධනය කරන්න.පිට යන වාහන නවත්තගන්න හැකි ක්‍රමවේද හදන්න.ඒවාට ගැලපෙන වෙළඳ කටයුතු කරන්න ඕනි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
මේ භූමිය සභාදේපලක්.නිශ්චිත ව කරන දෙයකට දෙන්න.සභාවට ආදායම් එන පරිදි.සභාව තින්දු කරන දේට දෙන්න.මේවාටත් පාලනයක් ඕනි.ගිවිසුම් අවශ්‍යයි.නැත්නම් කාලයක් යනකොට ගැටළු.ජනතා සේවයක් ලැබෙන ලෙස කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා
මන්ත්‍රීතුමියන්ලා කීව හෙල බොජුන්හල මොකද තත්වය?
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී දයා කස්තුරි මිය.

**දුම්රිය එකෙන් අවසර ඕනිළු.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**බෑ කීවේ නෑ.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා</u>

**ඒ ගැන නිශ්චිත තීරනයක් දෙන්න. ඉදිරි කටයුතු කලහැකියි.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**දෙන්න බෑ කීවාද?**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

**අපි ගත්ත තීන්දුව අනුව කටයුතු කරන්න.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී නයනා ජීවනී මිය.</u>

**ව්‍යපෘති වාර්තාව දෙන්නම්.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා</u>

**ව්‍යාපෘතිය දිලා තියෙන්නේ.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා</u>

**පුස්තකාලයක් දමන්න. ඔළු හදන්න.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**ව්‍යාපෘතිය දෙන්න.ශ්‍රමදානේ දවසේ කව්රුවත් ආවේ නෑ.ඒ කමිටුව වගකීම භාරගන්න. අනුමැතියත් දීලා තියෙන්නේ.එතන ප්‍රතිසංස්කරනය කරන්න ඕනි.ඇමතිතුමත් කතා කලා.දෙන්නම් කීව.බලෙන් කරන්න බෑ.මේ කටයුත්ත පිලිබඳව තව දුරටත් සොයාබලා සුදුසු ක්‍රමවේදයක් අනුව ගැලපෙන පරිදි ඉදිරිකටයුතු කරමු. විවිධ මත පලවුනා.ඒනිසා තව දුරටත් විමසා බලා සුදුසු පරිදි කටයුතු කරමු.සභාවට ආදායම් ලැබෙන පරිදි හා සභාවේ පාලනය ඇතිව කරමු. සති දෙකක් ඇතුලත වගේ කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතාගේ යෝජනාව අනුව</u>
කුරුවිට නගර මධ්‍යයේ ඇති ජල ටැංකිය යට ස්ථානය ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා කුරුවිට ග්‍රාමනිලධාරි වසමේ සමෘර්ධි ප්‍රතිලාභීන් කීප දෙනෙක් වෙත මාසික කුලි පදනම යටතේ ලබාදීම සම්බන්ධව **තව දුරටත් සොයාබලා සුදුසු ක්‍රමවේදයක් අනුව ගැලපෙන පරිදි ඉදිරිකටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.</u>

05-10.දොඩම්පෙ හොලිපිටිය කහවිට වත්ත මාර්ගයේ විසල් ජල යෝජනා ක්‍රමය යටතේ බට දැමීමට පළුදු කරන ලද මාර්ගය සම්බන්දයෙන් පරික්ෂන වාර්තාවක් ලබාගැනීම හි ඉදිරි කටයුතු සම්බන්ධ යෝජනාව.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා</u>

දොඩම්පෙ හොලිපිටිය කහවිට වත්ත මාර්ගයේ විසල් ජල යෝජනා ක්‍රමය යටතේ බට දැමීමට පළුදු කරන ලද මාර්ගය සම්බන්දයෙන් පරික්ෂන වාර්තාවක් ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේකුමාර මහතා**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා**

දොඩම්පෙ හොලිපිටිය කහවිට වත්ත මාර්ගයේ විසල් ජල යෝජනා ක්‍රමය යටතේ බට දැමීමට පළුදු කරන ලද මාර්ගය සම්බන්ධව කටයුතු කිරීමට කාර්මික නිලධාරි එනවා කීවත් තාම නෑ.සභාවට බැදපු මුදල් ගත යුතුයි.ඒ මුදල ගන්න ලියුමත් දුන්න.නමුත් කාර්මික නිලධාරි වාර්තා නැතුව බැ.මිනිස්සු මුදල ආපසු ගන්න බලා ඉන්නවා. මේ කටයුත්ත කඩිනම් කරන්න.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

**සතියක් තුල මේ කටයුත්ත සම්බන්ධව විසඳුමක් ලබාදෙමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතාගේ මහතාගේ යෝජනාව අනුව** දොඩම්පෙ හොලිපිටිය කහවිට වත්ත මාර්ගයේ විසල් ජල යෝජනා ක්‍රමය යටතේ බට දැමීමට පළුදු කරන ලද මාර්ගය සම්බන්දයෙන් පරික්ෂන වාර්තාවක් ලබාගෙන සතියක් තුල ඉදිරි කටයුතු කඩිනමින් සිදු කිරීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-11.වැඩිහිටි දීමනාව ඇතුළු අනෙකුත් දීමනා තැපැල් කාර්යාලය මගින් ලබාදෙන ලෙස දැනුම් දීම සම්බන්ධ යෝජනාව.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා**

වැඩිහිටි දීමනාව ඇතුළු අනෙකුත් දීමනා තැපැල් කාර්යාලය මගින් ලබාදෙන ලෙස දැනුම් දීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා**

මුලින් මේ ආධාරය දුන්නේ තැපැල් කාර්යාලයෙන්. ඒත් දැන් දෙන්නේ සමෘර්ධි බැංකුවෙන්. මේක සමහර වැඩිහිටියන්ට පලක් නැති දෙයක් වෙලා.උදාහරනයක් හොලිපිටියේ ඉදලා මේ ආධාරය ගන්න රු.1200.00ක් වියදම්කරගෙන යන්න ඕනි කිරිඇල්ලට.විශාල මුදලක් කාලයක් යනවා.රු.2000.00 ගන්න.හිටගෙන ඉන්න වෙනවා.මේ වැඩිහිටියන්ට ඇත්තටම කරදරයක්. ලාභයක් නෑ.ඒ නිසා අදාල අංශ දැනුවත්කරන්න.පරන විධිහ හොඳයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා</u>**

මේ වැඩිහිටි දීමනාව බැංකු සංගමයට අනුයුක්ත කරලා.අපිට භාරදූර කාර්යක්.ආබාධිත,වකුගඩු,පෝෂන ආදි සියළු දීමනා.සමහර වෙලාවට දින 6,7 ක් යන්න වෙනවා
නිලධාරින් වසමේ නැති උනොත්.පදිංචිය තහවුරු කරලා පොත් ලකුනු කරලද බලලා ආදි විවිධ නිර්නායක ටිකත් සම්පූර්න කරලා තියෙන්න ඕනි.පැරණි ක්‍රමවේදයට දෙන්න.මේ වැරුද්ද පෙන්නන්නේ.සමහර තැන්වල වංචා වෙනවළු.බටහිර පත්බේරිය එම්.ඩබ්.කේ.පියරත්න මාස තුනේ රු.15000.00ගිය සතියේ ලැබිලා තියෙන්නේ.වව්චර් අත්සන් අරන්.මේවා ප්‍රාදේශීය ලේකම් පරික්ෂා කරයි.මේ දීමනා දෙන ක්‍රමය අසාර්ථකයි.නැවත උපතැපැල් කාර්යාලය මගින් දෙන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>**

මේ යෝජනා කතා කලාට පමනක් මදි.දිස්ත්‍රික් ලේකම්ට යොමුකරන්න.රත්නපුර දිස්ත්‍රික් කමිටුවට ත් ඉල්ලීම් කරන්න.චක්‍ර ලේඛ තියෙන්නේ ජනතා සභායට .සමෘර්ධි අයට උපදෙස් දිලා තියෙන්නේ ආබාධිත අයට ගෙදරට ගිහින් දෙන්න කියලා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා</u>**

ආබාධිත අයට ගෙදරට ගිහින් දෙන්න ඕනි.නැවත කලින් විධිහට ලක්ෂයක් දක්වා දෙනවා.මේ තුනට ගෙවන්න.අත්තිකාරමක්. ගෙදරට ගිහින් දෙන්න ඕනි.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>**

ක්‍රමවේදයක් ඕනි.ඈත ඉඳන් එන අයට කරදරයක්.ගමේ මන්ත්‍රිවරයයි මේගැන හොඳින්ම දන්නේ.සභා තීන්දුව ගෙන කටයුතු කරමු.බස් ගාස්තුව අද ඉතා ඉහලයි.නිලධාරින් යථාර්ථය තේරුම්ගත යුතුයි.හැමදේම ඒ වගේ.සමාජයට අහිතකර දේ ඉවත් කිරීමට සටන් කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී චන්ද්‍රා බණ්ඩාර මිය.</u>**

අද අපේ වසමේ එක පවුලේ හතර පස්දෙනාට රු. 5000.00 බැගින් දීමනාව දීල.පොරොත්තු ලේඛනයේ ඉන්න.වහාම අදාල තැන්වලට,ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දන්වන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා</u>**
වංචා දූෂන පිටුදැකීමේ සංවිධානයෙන් තොරතුරු ඉල්ලා තියෙන්නේ.තොරතුරු දීලා තියෙනවා.අයිස් විකුනනවා කියලා ගෙවලුත් පරීක්ෂා කරලා.ඒ වෙලාවේ තිබ්ලා නෑ.මම වසමේ මන්ත්‍රි. ඒ නිසා අදාල කමිටුවෙන් විමසිය යුතුයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා</u>**

දොඩම්පේ ජනතාවට එපිටවෙලට යන්න ඕනි පෝර ගන්න.ත්‍රීවිල් වලට විශාල වියදමක්.දොඩම්පේ ගොවිජන **සේවා කාර්යාලය තියෙන්නේ.පරිපාලන ප්‍රශ්නළු.මේවා සංවර්ධනයට බාධා.ජනතා පීඩනයක්.අදාල ආයතනවලට ලියන්න.දෙසැම්බර් වන විට වත් කෘෂි**

**භාන්ඩ ,ද්‍රව්‍ය ගොවිජන සේවා එකෙන් ගන්න අවස්ථාව සලසන්න.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා</u>**

ඉස්සර දොඩම්පෙ ගොවිජන සේවා එකෙන් මේවා දුන්නේ.දැන් එපිටවෙල යන්න වෙලා.දොඩම්පෙ,කිතුල්පෙ,එපිටවෙල වසම් තුනේ පරිපාලනය .හෙට පුස්සැල්ලේ තියෙන රැස්වීමට කෘෂි අධ්‍යක්ෂ එනවළු.මාත් යනවා.අදාල ලිපි නිලධාරින්ට යවන්න.වැඩිහිටි ආධාර සම්බන්ධ දිස්ත්‍රික් ලේකම්ට අරින ලියුමේ පිටපත මට දෙන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා</u>**

මේ ආධාර බෙදාදීම සමෘර්ධි යටතට දුන්නට පස්සේ වකුගඩු දීමනාව කපන්න කියලා.මේ රෝගයක් වෙනුවෙන් දෙන දේ. සාධාරන නෑ.අදාල ආයතන දැනුවත්කරන්න.ප්‍රාදේශිය ලේකම්ව දැනුවත් කලාම මේ ආධාරය දෙන්න කීවට එහෙන් කපලා.සමෘර්ධිය යටතට දුන්නාම මේ ගැටළුවට හේතුව මොකක්ද?

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>**

මෙවැනි යෝජනාවක් මිට පෙරත් ගෙනාවා. වැඩිහිටි රු. 2000 දීමනාව අවු.70 ට වැඩි අයට දෙන දීමනාව.මේ සම්බන්ධව ගැටළු රැසක් තියෙනවා.පොරොත්තු ලේඛනයක් තියෙනවා.70 ට වැඩි කෙනෙක් ගිහින් මේ දිමනාව ඉල්ලුවොත් ඉදිරියෙන් ඒ දීමනාව දැනට ගන්න කෙනා මැරෙනකම් ඉන්න කියනවා. මේ කතාව ජාතියටම ලැජ්ජාවක්.සමෘර්ධියය තුල හොඳින් ජනතාවට හිතකර ලෙස සේවය කරන නිලධාරී අය ඉන්නවා.ඒ වගේම හොරුත් ඉන්නවා.විවේචන විතරක් වැඩක් නෑ. මේවා නවත්තන්න මේ සභාවට බෑ.අපිට පුළුවන් පෙන්වා දෙන්න.ප්‍රාදේශීය ලේකම්ට පුළුවන් මේවාට මැදිහත්වෙන්න.පැරඩයිස් වලත් කඩ දීම ගැන විවිධ කතා යනවා.මුදල් ඇතිහැකි අයටත් කඩ දීලා.මල්ලිකා බේකරිය වගේ.අයිස් ගැන වෙනම කතා කරමු.අපි දෙයක් නිරාවරනය කරන්න හැදුවාම නවත්තන්න එපා.මේ යෝජනාව කලේ ශානක මන්ත්‍රිතුමා.ඉහල තැන් වලින් කරන වැරදි වලට සභාවේ මන්ත්‍රීලට වග කියන්න බෑ.මේ යෝජනාවට අපි අත උස්සනවා.අපි ඒක විහිළුවකට ගනන් ගනනේ නෑ.අපිට එහෙම කලාට අපි කරන්නේ නෑ. මේක සභාව.

මේ අවස්ථාවේ සභාවේ දැඩි ගෝෂා පැවතුනි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා</u>**

අපේ කොට්ඨාශයේ ගැටළුව අපි සභාවට ඉදිරිපත් කලේ. සභාවට ඉදිරිපත් කරන්නේ ප්‍රශ්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>

අපි සභාය දුන්නා. වරදවා වටහා ගන්න එපා.යෝජනාව අනුව ඉදිරි කටයුතු කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා</u>

මේ සමෘර්ධි කඩ. ඒවා දෙන්නේ කාටද තීරනය කරන්නේ ග්‍රාම නිලධාරි,ප්‍රාදේශිය ලේකම් ඉන්න කමිටුවක්. අර කඩේ මල්ලිකා බේකරි නිශ්පාදන අරන් විකුනන්නේ වෙන පුද්ගලයෙක්.ඒ බඩයි කඩේ දාලා තියෙන්නේ .කොමිස් එකට. අර වාසනා බේකර්ස් තියෙන්නේ ඒ වගේ.අයිති අය වෙන අය.නමුත් වාසනා නමයි දාන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී චන්ද්‍රා බණ්ඩාර මිය.</u>

**නිලූකා කියලා දාන්න කියන්න.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

මේ වෙන කරුනු යි සාකච්ඡා කරන්නේ. අපි මේ යෝජනාව අනුව කටයුතු කරමු.ශානක මන්ත්‍රීතුමාගේ යෝජනාව අනුව මෙම තත්වය දිස්ත්‍රික් ලේකම්ට,අදාල අමාත්‍යාංශයට,අමාත්‍යතුමාට දැනුම් දෙමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx** <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතාගේ යෝජනාව අනුව</u>
වැඩිහිටි දීමනාව ඇතුළු අනෙකුත් දීමනා තැපැල් කාර්යාලය මගින් නැවත ලබාදෙන ලෙස දැනුම් දීම සඳහා ප්‍රාෙද්ශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම්,අදාල අමාත්‍යාංශය,ගරු අමාත්‍යතුමාව දැනුවත්කිරීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

05-12. දොඩම්පෙ කොට්ඨාශයේ අක්‍රිය වීදිලාම්පු අළුත්වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම සම්බන්ධ යෝජනාව.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා</u>

දොඩම්පෙ කොට්ඨාශයේ අක්‍රිය වීදිලාම්පු අළුත්වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

**අපෙත් තියෙනවා නඩත්තු කිරිමට විදිලාම්පු.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**එසේ නඩත්තු කල යුතු සියළු විදි ලාම්පු විස්තර අරන් ගනන් බලලා ගේමු.තීරනයට ඇතුලත් කරන්න.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා</u>

**කාර්මික නිලධාරි දෙන්නට අමාරුයි.අපි කෙනෙක් දමලා කරගන්නම්.ඒක සාර්ථකයි.විදුලි බල මණ්ඩලේ වගේ ඉන්න අඳුනන කෙනෙක්.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

**අපි අධීක්ෂනය කරනවා. කෙනෙක් දමලා කරන එක කඩිනම්.කාර්මික නිලධාරින් දෙන්නයි ඉන්නේ .**

**Xxxxxxxxxxxxxxx** **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ශානක දර්ශන මහතාගේ යෝජනාව අනුව** දොඩම්පෙ කොට්ඨාශයේ හා සියළු කොට්ඨාශවල අක්‍රිය විදිලාම්පු අළුත්වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාදීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.12.09 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 5-13 යටතේ වන සභා තීරනයේ උද්ධෘතය

05-13.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත අත්‍යවශ්‍ය සංවර්ධන යෝජනා වෙනුවෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනිම සම්බන්ධ යෝජනාව

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

කුරුවිට ප්‍රාදේශීය සභාවේ සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත අත්‍යවශ්‍ය පහත දැක්වෙනුංක **01** සිට **47** දක්වා වන සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරිම සදහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීම ට යෝජනා කරමි.ඒ අනුව

**01.** අධිකාරියේ ගොරකඇල මාර්ගයේඅධිකාරිය බෝක්කුව අසල මාර්ගය වැසිජලයෙන් යටවීම වැලැක්විමට වැවේ සිට කළු ගඟ දක්වා ඇල සුද්ද කිරිම. රු.600000.00 (ගරු ප්‍රා.ස.ම.ජී.එම් ජයරත්න මහතා)

**02.** ජයවර්ධන මාවතේ ජයවර්ධන මහතාගේ නිවස අසල මාර්ගය කොන්ක්‍රිට්කිරිම(ගරුප්‍රාසම ලක්මාල් මහතා) රු.600000.00

**03.** කරපිංච පළාත් මාර්ගයේ සිට කැන්ද ලන්ද මාර්ගය කොන්ක්‍රිට් කිරිම (ගරුප්‍රාසම ජනක විමලසිරි මහතා) රු.600000.00

**04.** කීරගලවත්ත ඉහලවත්ත මාර්ගය කොන්ක්‍රිට් කිරිම පහන් ගෙදර බෝධිය අසල( ගරුප්‍රාසමප්‍රේමා ගම්ලත් මිය.) රු.400000.00

**05.**කීරගල ඉහලවත්තේ මාර්ගයේ පෙට්ටිබෝක්කුව අත්වැට ඉදිකිරිම. ( ගරුප්‍රාසමප්‍රේමා ගම්ලත් මිය.) රු.150000.00

**06.** කිරිඇල්ල බි.සි.නිවාස මාර්ගය කොන්ක්‍රිට් කිරිම ( ගරුප්‍රාසම අසංක එරන්ද මහතා) රු.600000.00

**07.** කරුනාජීව මහතාගේ නිවස අසලමාර්ගය කොන්ක්‍රිට්

කිරිම ( ගරුප්‍රාසම ජීවන් රනතුංග මහතා)
රු.510000.00

08. පාතගම දුම්මලේ ගොඩ මංජුල මහතාගේ නිවස අසල සිට උපාලි මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රිට් කිරිම
( ගරුප්‍රාසම දිජ්ති චන්දන මහතා)
රු.600000.00

09.මැදගම හල්දොල ඇල ප්‍රතිසංස්කරනය කිරිම රු.1800000.00
(ගරු ප්‍රාසම)රත්නසිරි මහතා.

10.කළුන්ගොඩ ජනපදය මාර්ගය පළුදු සැකසිම සඳහා ද්‍රව්‍ය ආධාරදීම රු.50000.00
ගරු ප්‍රාසමදයා කස්තුරි මිය)

11.කැකුණහින්න හන්දියේ සිට ගල්වංගෙඩිය දක්වා ශ්‍රිපාදමාර්ගය
අළුත්වැඩියා කිරිම. රු.655239.86

12.බැවිල විතානකන්ද පාර ප්‍රතිසංස්කරනයකිරිම රු.80000.00
(ගරුප්‍රාසම සම්පත් බොතේජු මහතා)

13.අඹගහයට දිගනවත්ත මාර්ගය අළුත්වැඩියා කිරීම. රු.299900.00
(ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා )

14.මැණික්දොල ට්‍රාන්සපෝර්මයඅසලින් මාර්ගය කොන්ක්‍රිට් කිරිම. රු.599738.80
(ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා)

15.තිඹිරිගස්හේන තුන්දොල මාර්ගය සංවර්ධනය කිරිම. රු.599738.80
(ගරු ප්‍රාසම මංගල ඩයස් මහතා)

16.බටුහේන- කාහේන්ගම දක්වා මහඇල ඇල කපා රොන්මඩ හා අනවශ්‍ය ගස් ඉවත් කිරිම. (ගරු ප්‍රාසම රුවන් අශෝක මහතා) රු.1500000.00

17. ඕවිටිගම මැදගම රජඇලකපා රොන්මඩහා අනවශ්‍ය ගස් ඉවත්කිරිම (ගරු ප්‍රාසමරත්නසිරි මහතා.) රු.1500000.00

18.වලව්වත්තේ සිට දෙල්ගමුවරජමහා විහාරමාවත දක්වා ගංවතුරට යටවීම වැලැක්විමට පරගස්ඕවිට ඇල කපා පලල්කර සංවර්ධනය කිරිම. රු.2000000.00

19.බටුහේන සමගිතරු වොලිබෝල් පිටිය සංවර්ධනය කිරිම. රු.200000.00

20.කොස්ගොඩ ප්‍රජාශාලාව උඩපාරකොන්ක්‍රිට් කිරිම. රු.200000.00

21.පැරඩයිස් පන්සල අසල සිට වැදගොඩැල්ල දක්වා මාර්ගය යටවීම වැලැක්වීමට ජලය බැසයන ඇල මාර්ගය කපා පලල් කිරිම. රු.1000000.00
(ගරු ප්‍රාසම රුවන් අශෝක මහතා.)

22.වත්තහේන ජලයෝජනාක්‍රමය ව්‍යාපෘතියප්‍රතිසංස්කරනය කිරිම. රු.150000.00
(ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා)

23.නාමල්දෙනිය ප්‍රජා මධ්‍යස්ථානය වැඩිදියුණු කිරිම. රු.900000.00
(ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා)

24.වටප්පිටිය බෝධිරාජ බෞද්ධ මධ්‍යස්ථානය මාර්ගය පළුදු වසා ප්‍රතිසංස්කරනය කිරිම රු.1000000.00

**25.**මෙණේරිපිටිය වසමේ බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉහල මහලේ කනු කොන්ක්‍රිට් කර ඉදිකිරිම. ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ) රු.3000000.00

**26.**කුරුවිට නගරයේ මහජන වැසිකිලිය ප්‍රතිසංස්කරනය කිරිම. රු.5000000.00
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා )
**27.**බැවිල විතානකන්ද මාර්ගය ප්‍රතිසංස්කරනය. රු.70000.00

**28.**පත්බේරිය පොල්කොටුව මාර්ගය කොන්ක්‍රිට් කිරිම රු.500000.00
( ගරු ප්‍රා.ස.ම.සම්පත් බොතේජු මහතා)
**29.**වර්නගල සිට හැරමිටිපාන දක්වා මාර්ගයේ කඩතොළු තැන් සකසා පඩි බැඳ අත්වැල් දමා සංවර්ධනය කිරිම හා සීත ගගුලේ ලහට කම්බි පාලමක් දැමීම

**30.**නො.04 කැන්ද ලන්ද මාර්ගයකොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරිම. රු.600000.00
( ගරු ප්‍රා.ස.ම.ජනක විමල සිරි මහතා)

**31.**කොස්ගල පහලවත්ත මාර්ගය බැකෝ යන්ත්‍රයක් යොදා පස් කපා සංවර්ධනය කිරිම. රු.200000.00
( ගරු ප්‍රා.ස.ම.ජනක විමල සිරි මහතා)
**32.**හල්පෙ තැපැල්ගම කනත්තට යන මාර්ගය කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරිම. රු.300000.00

**33.**මෙණේරිවත්ත හරහා ඉහල වත්ත පාර පස් පිරවිම
**34.**කදංගොඩ ජනපදයේ ප්‍රධාන පාරේ කැඩී ඇති ස්ථාන අළුත්වැඩියා කිරිම. රු.450000.00
( ගරු ප්‍රා.ස.ම.දයා කස්තුරි මිය)
**35.**පාසැල් වලට හා දහම්පාසල් වලට පොත් ලබා දීම රු.400000.00
( ගරු ප්‍රා.ස.ම.දයා කස්තුරි මිය)
**36.**නඩුකාරදෙනිය වෙනිවැල්ලාව පාර ගංවතුරෙන් යටවන ස්ථාන සකස් කිරිම ( ගරු ප්‍රා.ස.ම.මංගල ඩයස් මහතා) රු.950000.00

**37.** අඹගහයට දිගනවත්ත මාර්ගය උළුත්වැඩියා කිරීම **රු.300000.00**

38.මෙණේරිපිටිය මැල්වත්ත මාර්ගයේ සේකර මහතාගේ නිවස අසල කැඩි ගිය කොටසට පැති බැම්ම බැදිම රු.600,000.00

39..උඩුකුඹුර මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිම රු.1,000,000.00

40. තලාවිටිය අඩක් නිමකර ඇති කේතුමති බහු කාර්යය ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිමකිරිම රු.2,000,000.00

41. තලාවිටිය පොදු සුසාන භූමිය ගොඩනැගිල්ලේ දිරාපත් වහලය අළුත්වැඩියා කිරිම 800,000.00
**42.** කිවුලකොටුව බුබුල නාන තොටුපල ප්‍රතිසංස්කරණය කිරීම

**43.**බටුහේනවත්ත ළමා මාතෘ සායනය ගොඩනැගිල්ල අළුත්වැඩියාව රු.500000.00
**44.**බටුහේනවත්ත විලකොලදෙනිය යා කරන මාර්ගයේ කැඩිගිය බෝක්කුව අළුත්වැඩියාව. රු.200000.00

**45.**තුංඅඳහේන පන්සල පාර ප්‍රතිසංස්කරනය කිරිම. රු. 1000000.00

**46.**කිවිලකොටුව දියුනවත්ත පාරේ කැඩිගිය කොටස අළුත්වැඩියාකර ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිම රු.500000.00
**47.** මෙනේරිවත්ත හා වෙලබඩ වත්තේ කෙලවර පිහිටි දොරුවලැ කුඹුර පන්විල කුඹුර අස්වැද්දුම අසලින් මාර්ගයේ කැඩි ඇති සකස්කර සංවර්දනය කිරිම රු.800000.00

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

රාජ්‍ය පරිපාලන ,ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය මගින් සියළුම පළාත් ලේකම් වරුන් අමතා එවන ලද 2022.09.27 දිනැති හා PL/7/10/7-තාව අංක දරන ජනතා හිතකාමී කාර්යක්ෂම සේවාවක් වෙනුවෙන් මහජන සේවා අඛන්ඩව පවත්වාගෙන යාම යටතේ වන ලිපිය මගින් පළාත් පාලන ආයතන විසින් පොදු ජනතාව වෙත සපයන සේවා වෙනුවෙන් බදු මුදල් බලපත්‍ර ගාස්තු සහ වරිපනම් වැනි අය කිරිම් සිදු කරන බැවින් එම රැස්කරනු ලබන ආදායම් උපයෝගී කර ගනිමින් එම බල ප්‍රෙද්ශ වල වර්ෂාවෙන් හා ජලගැලීම් වලින් හානියට පත් මාර්ග පිලිසකර කිරීමේ වැඩපිළිවෙලක් සකස්කර ගන්නා ලෙස දන්වා ඇත.එසේම පළාත් පාලන ආයතනයේ අරමුදල් හා පලාත් සභා අරමුදල් යොදවා පළාත් පාලන ආයතන වල අත්‍යවශ්‍ය පොදු පහසුකම් නඩත්තු කිරිම හා පවත්වාගෙන යාම ට සුදුසු පියවර ගන්නා ලෙසත් දන්වා ඇත.
අත්සන් කර ඇත්තේ එම අමාත්‍යංශයේ ලේකම් විසින් .අඩක් නිම කර ඉතිරි කල ඒවා කල හැකියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

වටප්පිටිය බෝධිරාජ බෞද්ධ මධ්‍යස්ථානය මාර්ගය පළුදු වසා ප්‍රතිසංස්කරනය කිරිමට ලක්ෂ 10 ක් ප්‍රතිපාදන ඉල්ලුවා.ගරු සභාපතිතුමා කීවා මුලින් ලක්ෂ 06 ක් ඉල්ලන්න කියලා.කෙසේ උනත් මේවන විට හැකියා වාර්තා අරන් ලේඛන සියල්ලත් ගත්තා.බටහිර පත්බේරිය ගොවි සංවිධානය ප්‍රිමික්ස් ගෙනත් බාලා. මට මේ කර්මාන්තය කරන්න බැරිඋනෝත් විශාල ගැටළුවක් වෙනවා.ලේකම්තුමිය මේ කටයුත්ත සදහා අනුමැතිය ගන්න.මුදල් නොලැබුනොත් මම සභාව ඉදිරිපිට උපවාස කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

දුරකථනයෙන් මේ සම්බන්ධව ගරු ජානක වක්කුඹුර ඇමතිතුමා එක්කත් කතා කලා.කල හැකි යෝජනා හදලා එවන්න කීවා.ගිහින් කතා කරන්න යන්න වෙයි.
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

පරන ඒවා කල හැකියි.ලේකම්තුමිය අළුත් එ්වාටත් අනුමැතිය ඉල්ලන්න.සියළු කරුනු එක්ක යොමු කරන්න.මේ ලිපිය අනුව කල හැකි දේ කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

හේතුව වෙන වෙනම දක්වලා අරින්න.අපි ගිහින් කතා කරලා ගරු ආන්ඩුකාරතුමාගෙන් අනුමත කරගමු.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

ලිපිය අනුව ක්‍රමවේදයක් සකසා ගත යුතුයි.අපේ පලමු සංවර්ධන වැඩ නැවැත්තුනේ මුදල් අමාත්‍යාංශයේ 03/2022 චක්‍ර ලේඛනය නිසා.පලාත් සභාවෙන් අපි මුදල් ඉල්ලුවට නෑ. අපි හඳාගත යුතුයි අපේ එකතුවෙන ආදායමින් කල හැකි , පනත අනුව විෂය පථයට අයත් ,කල යුතු වැඩ පමනක්.පනත අනුව සභාවට කල හැකි දේයි මේ කියන්නේ. ආයේ ආයේ කල හැකි දේ අහලා හැල්ලුවට ලක් වීමයි වෙන්නේ. අත්‍යවශ්‍ය අපිට කල හැකි දේ අතර ජල ගැලිම් වලදී මඩ වගුරු ආදිය හැදුනාම ඒ උවදුර ඉවත් කිරිමට ඒ කටයුතු කල හැකියි.වැසිකිලි සම්බන්ධව පුළුවන්.මේ පළාත් පාලන ආයතනයේ මුදලුයි යොදවන්නේ.

මේකට ක්‍රම වේද හදන්න.සෑම ව්‍යාපෘතියකටම සටහන් හදන්න අවශ්‍යයි.ඒ නිසා යෝජනාවේ කරුනු ඇත්ලත් කරලා සෑම ව්‍යෘපාතියටම සටහනක් හදන්න.මේ ගැන පළාත් සභාවෙන් ලැබුන ප්‍රතිචාරය මොකක්ද?

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

මේ ලිපිය ලැබුනේ නැතිළු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

මේ ලිපියේ අත්සන තියෙන්නේ ලේකම්තුමාගේ. ඒනිසා වෙනත් අවසරයක් අවශ්‍ය නෑ.සමගාමී ලැයිස්තුවේ විෂයක්.ඒ නිසා වෙනත් අවසර අවශ්‍ය නෑ .

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

මේ ලිපිය තවම කොමසාරිස්තුමාට දීලා නැතිලු.වට්ස් ඇප් කලා.අපි ලිපිය ගිහින් ගෙනාවේ.මේක පැහැදිලි කරගන්න ඕිනි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

අමාතශ්‍යාංශ ලේකම් ලබාදීඇති උපදෙස් ප්‍රකාරව සභා අරමුදලෙන් කරන්න දුන්න ලිපිය අනුව කටයුතු කරමු.අපි මේ සභා තීන්දුව එක්ක යවමු. 22.09.27 ලිපියයි අදාල විස්තර එක්ක.කොමසාරිස්තුමා අපිට උපදෙස් දිය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

පළාත් පාලන ලේකම්තුමාගේ ලිපිය අනුව සභා අරමුදල් යොදවලා යටිතල පහසුකම් හා සංවර්ධන කටයුතු කිරිමට අවශ්‍ය ඉදිරි කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා

ප්‍රතිසංස්කරන කටයුතු කල හැකියි.සියළු දෙනාගේ යෝජනාවලට මේ තුලින් අවස්ථාව ලබාදෙන්න.කොමසාරිස්තුමාට නීත්‍යානුකුලව ලිපිය ලැබ් නැත්නම් දැනුවත් කරලා අරින්න කියන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

අළුතෙන් වැඩවලට විතරළු අනුමැතිය ගන්න ඕනි.ලේකම්තුමිය මේ ගැන විමසන්න.මේ ලිපියත් සමග කොමසාරිස්තුමාගෙන් උපදෙස් හා ඒ විස්තරය විමසන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ යෝජනාව අනුව රාජ්‍ය පරිපාලන ,ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් සියළුම පළාත් ලේකම් වරුන් අමතා එවන ලද 2022.09.27 දිනැති හා PL/7/10/7-තාව අංක දරන

**ජනතා හිතකාමී කාර්යක්ෂම සේවාවක් වෙනුවෙන් මහජන සේවා අඛන්ඩව පවත්වාගෙන යාම යටතේ වන ලිපිය සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් ලබාගැනීමටත් කුරුවිට ප්‍රාදේශීය සභාවේ සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත ඉහත දැක්වෙන අංක 01 සිට 47 දක්වා වන අත්‍යවශ්‍ය සංවර්ධන යෝජනා වෙනුවෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීම ට ත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

2022.12.09 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 5-13 යටතේ වන සභා තීරනයේ සත්‍ය උද්‍ධෘතයක් බව සහතික කරමි.

එස්.එච්.ආර්.වීරක්කොඩි,
ලේකම්, ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

05-14. කුරුවිට **ප්‍රාදේශීය සභාවේ අනියම් පදනම මත ( සේවා ගිවිසුම් මත )බඳවාගෙන ඇති සේවකයින් ගේ සේවා ගිවිසුම්** 2023 වර්ෂය සඳහා අළුත් කිරීම සම්බන්ධ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

කුරුවිට **ප්‍රාදේශීය සභාවේ අනියම් පදනම මත ( සේවා ගිවිසුම් මත )බඳවාගෙන ඇති පහත නම් සඳහන් සේවකයින්** 2023 වර්ෂය සඳහා නැවත සේවයට යොදවා ගැනීමටත්ඒ සඳහා සේවා ගිවිසුම් අළුත් කිරිමට හා වැටුප් ගෙවීමටත් යෝජනා කරමි.

01.ඩී.එස්.මීගස්තැන්න මයා සෞඛ්‍ය කම්කරු.
02.එච්.සුජිත් නිශාන්ත මයා සෞඛ්‍ය කම්කරු.
03.යූ. නිමල් ජයසිංහ මයා සෞඛ්‍ය කම්කරු.
04.එන්.ජී.ඩී. නුවන් ධර්මසේන මයා. සෞඛ්‍ය කම්කරු.
05.පී.ඩී.එස්.සමන් කුමාර මයා. සෞඛ්‍ය කම්කරු.
06.එස්.ආර්.ඒ.සමරකෝන් මයා සෞඛ්‍ය කම්කරු.

07.ඒ.ඒ.ක්‍රිස්ටෝපර් මයා සෞඛ්‍ය කම්කරු.
08.ඩබ්.ඩී.ඒ.කේ.වෙත්තසිංහ මයා සෞඛ්‍ය කම්කරු.
09.ඩී.ඒ.පුෂ්පකුමාර මයා සෞඛ්‍ය කම්කරු.
10.පී.ජී.සුජීවනී ප්‍රේමසිරි මයා සෞඛ්‍ය කම්කරු.
11.එම්.ඒ. හරිශ්චන්ද්‍ර මයා වැඩ ක්ෂේත්‍ර කම්කරු
12.පී.ඩී.සමන් කුමාර මයා රියදුරු
13.පී.කේ උදිත ගයාන් රියදුරු
14.ජී.එම්.එම්.ආර්.සෙනෙවිරත්න මුරකරු
15.එච්.ඩී.උදය මදුෂාන් විදුලි කාර්මික

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ යෝජනාව අනුව** කුරුවිට **ප්‍රාදේශීය සභාවේ අනියම් පදනම මත ( සේවා ගිවිසුම් මත )බඳවාගෙන ඇති ඉහත නම් සඳහන් සේවකයින්** 2023 වර්ෂය සඳහා නැවත සේවයට යොදවා ගැනීමටත්ඒ සඳහා සේවා ගිවිසුම අළුත් කිරීමට හා වැටුප් ගෙවීමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-15. කුරුවිට **ප්‍රාදේශීය සභාවේ නිශ්කාර්යව ඇති ගලි බවුසරය ,නිවිතිගල ප්‍රාදේශීය සභාවට ගලි බවුසරයක් ලබාගන්නා තෙක් එහි සේවා කටයුතු සඳහා ලබාදීම සම්බන්ධ** යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

කුරුවිට **ප්‍රාදේශීය සභාවේ නිශ්කාර්යව ඇති ගලි බවුසරය ,නිවිතිගල ප්‍රාදේශීය සභාවට ගලි බවුසරයක් ලබාගන්නා තෙක් එහි සේවා කටයුතු සඳහා ලබාදීම සම්බන්ධව මහා සභා අනුමැතියක් ලබාදීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.අවශ්‍ය අනුමැතීන් ගන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**නිවිතිගල ප්‍රාදේශීය සභාව සතුව පැවති ගලි බවුසරය අනතුරකකට ලක්වීම හේතුවෙන් මේ වන විට එම ගලි සේවාව ලබාදීමට නොහැකි වී ඇති බවත් තාවකාලිකව එම සේවාව සැපයීමට කහවත්ත සභාවේ ගලිබවුසරය ලබා ගත්තත් එය නැවත ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇති බවත් නිවිතිගල ප්‍රාදේශීය සභාවට ගලි බවුසරයක් ලබාගන්නා තෙක් එහි සේවා කටයුතු සඳහා යොදවා ගැනීමට අප සභාවේ නිශ්කාර්යව ඇති ගලි බවුසරය ඉල්ලා නිවිතිගල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති විසින් අංක නිප්‍රාස/10/01/01/2020හා 22.10.25 දිනැති ලිපියෙන් ඉල්ලීමක් සිදුකර ඇත. එසේම ඔවුන්ට නව බවුසරයක් ලබාගන්නා තෙක් මෙම බවුසරය දෙන**

**ලෙසද ඒ දක්වා සියළු නඩත්තු කටයුතු වියදම් දරා තම සභාව මගින් සිදුකරන බවත් දන්වා ඇත. පලාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක** ACLG/04/05/01 YD 22.09.27 **දිනැති ලිපියෙන්ද එම සභාවට නව ගලි බවුසරයක් ලබාගන්නා තෙක් මෙම සභාවේ බවුසරය ලබාදී සහාය පලකිරිමට එකගනම් සභා එකගත්වය ලබාගන්නා ලෙස දන්වා ඇත.**
**අපේ සභාවට බවුසර් දෙකක් තියෙනවා.භාවිතයක් නෑ.මේ එකක් දුන්නොත් අපෙන් ගලි ගන්නම්එ.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා.</u>

**කුරුවිට සිට නිවිතිගලට විශාල ප්‍රවාහන වියදමක් යයිද? ප්‍රවාහන කුලිය ගෙවන්න වෙයි නේද?එකඟතාවක් ගන්න.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**එකඟතා අරන් කරමු.අපිට දාන්න තැනක් නෑ.අවශ්‍යතාවය තියෙනවා.රත්නපුර නගර සභාවේ වැඩ පිලිවෙල වගේ ක්‍රමයක් හදාගමු.නිවිතිගලට දෙන එකෙන් අපිට ආදායමක් නැනේ.අපිට ස්ථානයක් නෑ.ගලි තිබුනට හදලා වැඩකුත් නෑ.භාවිතා නොකර. ගලි සේවය පවත්වාගෙන යාමට අපි ස්ථානයක් සොයාගත යුතුයි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා.</u>

**මේ කටයුත්ත සිදු කල යුත්තේ පනත අනුව. ගලි සේවය සඳහාත් අතුරුව්‍යවස්ථාවක් සකසන්න.ගිවිසුම් සැකසිය යුතුයි.නීත්‍යානුකූලව කටයුතුකරන්න.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**ගිවිසුම් සකසා කටයුතු කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**_ගරු **සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ යෝජනාව අනුව හා නිවිතිගල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති විසින් අංක නිප්‍රාස/10/01/01/2020හා 22.10.25 දිනැති ඉල්ලීම් ලිපිය අනුව** කුරුවිට **ප්‍රාදේශීය සභාවේ නිශ්කාර්යව ඇති ගලි බවුසරය ,නිවිතිගල ප්‍රාදේශීය සභාවට ගලි බවුසරයක් ලබාගන්නා තෙක් එහි සේවා කටයුතු සඳහා ගිවිසුම්ගතව, නීත්‍යානුකූලව ලබාදීමට මහා සභා අනුමැතියක් ලබාදීමට ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-16.කුරුවිට **ප්‍රාදේශීය සභා** බල **ප්‍රදේශයේ සිටින** කාබනික පොහොර හා වෙනත් නිශ්පාදන සිදු කරන ව්‍යවසායකයින් සඳහා කාබනික නිශ්පාදන අලෙවිකරගැනීමට ස්ථානයක් ලබාගැනීම සම්බන්දව කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය මගින් ඉදිරිපත්කර ඇති ඉල්ලීම සම්බන්ධ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

කුරුවිට **ප්‍රාදේශීය සභා** බල **ප්‍රදේශයේ සිටින** කාබනික පොහොර හා වෙනත් නිශ්පාදන සිදු කරන ව්‍යවසායකයින් සඳහා කාබනික නිශ්පාදන අලෙවිකරගැනිමට ස්ථානයක් ලබාගැනීම

සම්බන්දව කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය මගින් ඉදිරිපත්කර ඇති ඉල්ලීම සම්බන්ධව මහා සභා තීරනයක් ගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩිලාන් දර්ශන මහතා.

එම යෝජනාව ස්ථිර කරමි

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**මෙම ඉල්ලීම සිදුකර ඇත්තේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින්.ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන වන කාබනික පොහොර එලවළු පැල,බිත්තර වී හා වෙනත් නිෂ්පාදන අලෙවිකර ගැනීමට ස්ථානයක් නොමැති වීම ගැටළුවක් වී ඇති බවත් පෙන්වා ඇත.ඒ අනුව මිල්ලවිටිය කුරුවිට ආර්.ඩී.ඩී.රණසිංහ මහතා හ ටද එම ගැටළුව පවතින අතර තමාගෙන් අලෙවි ස්ථානයක් ලබාදෙන ලෙස ඉල්ලිම් කර ඇති අතර ඒ සඳහා සභාව සතුව එවැනි ස්ථානයක් පවතීනම් ලබාදෙන ලෙස ඉල්ලා ඇත.මෙම කටයුත්ත සදහා යම් සථානයක් හඳුනාගතහොත් ලබාදෙමු. බල ප්‍රදේශයේ ජනතාවට මුල් තැනක් දීලා කටයුතු කරමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මංගල ඩයස් මහතා.

**මේක බොරු කටයුත්තක්.කාබනික කියලා දෙන්නේ වැව් මඩද මන්දා.නබකොල කැලි පවා තියෙනවා.රසායනික පෝර නැතිව බෑ.රසායනික පොහොරින් ගසට ලැබෙන ඒ පෝෂන සංයුතිය කාබනික පෝරින් දිය යුතුයි.නමුත් ඒක එහෙම වෙන් නෑ.මම මේ ගැන හිටපු ගරු ජනපති ගෝඨාභය මහතාට කීවා.සමන් දේවාලයේදී.මේ ප්‍රතිපත්තිය හරියන්නෑ කියලා.විවිධ තැන්වල වාද උනා.එලදායී අස්වැන්නක් ලැබෙන්නෑ.ගොවියා විශාල ගැටළුවකට මුහුණ දුන්නා.මේ කාබනික කතාව බොරුවක්.නිසි සංයුතියක් නෑ.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩිලාන් දර්ෂන මහතා.

**මම හිතන්නේ සභාවේ ජේෂ්ඨ මන්ත්‍රිවරයෙක් මේලෙස කතා කිරීම ඇත්තටම කනගාටුවට කරුණක්.අතීතයේදි මේ පොලව සරුසාර වගා බිමක් වෙලා තිබුනේ කාබනික පොහොරින් පමනක්.එකල මේ කිසි රසායන පෝරක් තිබුනේ නෑ.ඉංග්‍රිසින් මේ තත්වය නැති කලා.එකවළු ඉක්මනින් අස්වැන්න බලාපොරොත්තුව අපේ කෘෂි රටාව නැතිකලා.නමුත් මේ කාබනික පොහොර ඇත්තටම ගසකට වැඩිමට වගාවට අවශ්‍ය සියළු පෝෂනය සහිත නිසි සංයුතිය ඇති පෝර. ඒවාට ප්‍රමිති සහතික තියෙනවා.නමුත් වෙළඳපලේ ඇති ඇතැම් පෝරවල කිසි ගුනාත්මක තත්වයක් නැති ඒවත් තියෙනවා.මේ කාබනික පෝරවල සංයුතිය සහතික කල සහතිකය තිබිය යුතුයි.මමත් ගොවියෙක්.මගේ සෘජු දායකත්වය දෙනවා .මීට පෙර හෙළ බොජුන්හල සඳහා අනුමැතිය දුන්න බිම් කොටසේ අඩි 30x22 කොටසක් . ඒ අතර ඉඩකොටස අඩි 8x 10 කොටස මේ කටයුත්තට ඇති.කාබනික පෝර ලක් පෝර වගේ ඒවට ඉඩ දෙන්න.මමත් කාබනික පොහොර හදනවා.ටොන් 20 ක් මසකට.තත්ව පරික්ෂන**

කරනවා.ව්‍යාපෘති වාර්තාව කාර්මික නිලධාරි මිස්ට දීලා තිබුනා.පිටපත දැන් ගෙනෙයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා.

මාගැන සඳහන් කලා "මා දන්නා ප්‍රමානය අනුව" කියලා. එය ඉල්ලා අස්කරගන්න.
ගහක්වත් වැවෙන්නැති පොහොර.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ෂන මහතා.

කාබනික වගාවේ ගෞරවයට හානි කරන්න එපා.ඔබතුමා සඳහන් කලේ ඔබතුමාගේ දැනුම අනුව.මේ පෝර ප්‍රමිතිය ඇති ඒවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිණී මහතා.

මම අක්කර 3ක් ගොවිතැන් කලා.කුඹුරු වගාවට මේ කාබනික පෝර ගැලපෙන්නෑ.මම සාක්කි.ඔය කියන බිජ ගැලපෙන්නෙත් නෑ.කාබනික පෝරවලට.මේ කිසිවක් නොගැලපීම් මත නිසා අසාර්ථකයි.ජනතාව නොමග යවනවා.මේ කාබනික තකාව බොරුවක්.දියර පෝර ගැහුවා.සාර්ථක නෑ.ඒවායේ අඩුපාඩු.ඒ පෝරවලට බිජ මැව් කලොත් හරියයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිප්ති චන්දන මහතා.

මේ කාබනික පෝර නරක නෙවෙයි.ගැටළුව මේ පෝර ගුනාත්මක බවින් යුතුව නිශ්පාදනය නොවිමයි.අපි කුඩා කාලේ වගා කලේ මා වී,කුරු වි වගේ ඒවා.මාස 6න් තමා අස්වැන්න ගත්තේ.දැන් මිස තුනෙන් අස්වනු ගන්න රසායන පෝර දමනවා.ඒ දිනවල ගොයම් කැපුවාම උස ට ඉපනැල්ල.ඒ ඉපනැල්ල මාස 6ක් දිරලා පසටම පෝරවෙනවා.දැන් මේ කිසිවක් නෑ.දෙමුහුන් නිසා සේරම.රසායන පෝර ඕනි උනේ ඒ නිසා.ගිය ගමන කුඹුරු යූරියා නැතුවත් සරුසාරව තිබුනා.අපි කුකුල් අපද්‍රව්‍යත් ටිකක් දැම්මා.රු.100,200 වගේ සුළු මුදලට මේ පෝර තියෙනවා.හොඳ පෝරක්.මේ ගමන පතල් වලක මම ලොකු මාළු වගයක් ඇති කලා.හිටිහැටියේ මුන් වතුරේ උඩ පාවෙනවා.බැළුවාම කුඹුරුවලට ගහපු යූරියා හෝදගෙන ඇවිත් මාළුන්ට විස වෙලා.රසායන පෝර එපා කියන්නෑ. නමුත් අපේ දරුවන්ගේ ඉදිරි පරපුර අවධානමක.පිළිකා බෝ නොවන රෝග ,අපේ ලමයි නිතර ලෙඩ වෙනවා.තරුන අය මැරෙනවා. නිතර.ඉස්සර වගේ නෙමේ.වකුගඩු රෝග.මේ රසායන පෝරවල ප්‍රතිවිපාක.ඉතින් හැකි තාක් රසායන දේ වලින් මිදිලා දරුවන්ට හරි කාබනික දේ දෙමු.සුවදායි ජිවිතය වටිනවා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

තරංග මන්ත්‍රීතුමා ගොවියෙක්.ඒ ගැන වාදයක් නෑ.හයිබ්‍රිඩ් බෝග වලට මේ ගමේ පෝර ගැලපෙන්නෑ.ඒ වගේමයි දීප්ති මන්ත්‍රීතුමා කීව දේ .අපිට වැරදුනා.බොහෝ දරුවන්ට දැන් පිළිකා අවධානම.නමුත් ඒ වැඩිහිටිකාටවත් ජාන වලවත් පිලිකා කාරක නෑ.පරීක්ෂනවලින් හෙළිවෙන්නේ කාපු ආහාර වල විෂ.කාබනික පෝර සදහා අලෙවියට ස්ථානයක් දෙන්න.ප්‍රමිතියක් සහිත පෝර පමනක් ගන්න.ප්‍රමිති සහතික ගන්න ඕනි.මේ නිෂ්පාදන වලට උදව් කරමු. මාත් උත්සහ කරනවා.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**පෝර ගැන හොඳ නරක දෙකම මේ අදහස් දැක්වුවා.කාබනික පෝර ආන්දෝලනය.**

**හොඳ ප්‍රමිතියෙන් යුතු පෝර හොඳයි.මේ පොහොර අලෙවි ස්ථානයක් දීම පිලිබඳව නිත්‍යානුකූලව දිය හැකි සහායක් දෙමු.** තව දුරටත් මේ සම්බන්ධයෙන් කරුනු සොයාබලා

**මේ පොහොර අලෙවි කිරිමට ස්ථානයක් දීම සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**_ගරු **සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ යෝජනාව අනුව සහ** කුරුවිට **ප්‍රාදේශීය සභා** බල **ප්‍රදේශයේ සිටින** කාබනික පොහොර හා වෙනත් නිශ්පාදන සිදු කරන ව්‍යවසායකයින් සදහා කාබනික නිශ්පාදන අලෙවිකරගැනිමට ස්ථානයක් ලබාගැනීම සම්බන්දව කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය මගින් ඉදිරිපත්කර ඇති ඉල්ලීම අනුව තව දුරටත් මේ සම්බන්ධයෙන් කරුනු සොයාබලා **පොහොර අලෙවිකිරිමට ස්ථානයක්ලබා දීම සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-17. කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පුස්සැල්ල ආදාහනාගාරයේ ආදාහනගාස්තු 2023 වර්ෂය සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පුස්සැල්ල ආදාහනාගාරයේ ආදාහනගාස්තු 2023 වර්ෂය සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**ගියවර සභාවේදි කිව්වා මෙම ආදාහනාගරයේ වියදම් පිලිබද විස්තරයක් ඉදිරිපත්කරන බව. එසේම ඒ අනුව අපි මෙම ගාස්තු සංශෝදනයකට යා යුතු වෙනවා.ඒ අනුව 2022 ඔක්තොම්බර් මස ආදාහනාගරයේ වියදම් විස්තරය සභාගත කරමි.මේ විස්තරය අනුව සියළු වියදම් හා සසඳා බැලුවිට මේ වන විට ආදාහනයක් සඳහා රු.11339.89 ක මුදලක් වැය වෙනවා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා.

**මාස කීපයකට පෙර රු.8000.00 තිබුන ආදාහන ගාස්තුව රු.10000.00 කලා. ගාස්තුව ඉහල දැම්මා.දැන් තියෙන්නේ රු.10000.00 හා 11000.00.මේ ගාස්තුව ඉහල දැමීමට මම එකඟ නෑ.ජනතාව දැඩි අසීරු තත්වයක ඉන්නේ.මෙයට වඩා පාඩු ඇතැම් කරුනු නිසා සභාව විදිනවා.මේ ආදාහනාගාරයට ඇත්තටම සභාවට මූලික ප්‍රාග් ධනයක් වැය වී හෝ ගෙවීමට නයක් ලබාගෙන නෑ.ලක්මාල් මැතිතුමාත් ආර්.ටී.එස්.ලලිත් මැතිතුමාත් මූලිකත්වය ගෙන පූජ්‍ය වජිරබුද්ධි ස්වාමින් වහන්සේගේ ඉල්ලීමකට මෙය ඉටු කලා.මෙහි අරමුන වෙනස්.ජනතාවට සහනයක් ලබා දීම.මේ වසර තුලදී මෙතරම් ප්‍රමානයක් ගාස්තු ඉහල දැමීම උචිත නෑ.දැනට අයකරන මුදලම තියන්න.ආන්ඩුව වගේ කටයුතු කරන්න එපා.ජනතාවට අමාරු අවස්ථාවේ තවත් පීඩනයක්.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා.

**ගරු මංගල මන්ත්‍රීතුමා කියන තත්වය සම්පූර්න සත්‍යයි.පවුල් දෙකක මරන උනා.ආදාහනේට වත් මුදල් වැයකරගත්තේ දැඩි අපහසුවෙන්.වර්තමාන තත්වය අනුව මේ මරනේ කටයුතු පවා කරගන්න එක මිනිස්සුන්ට ගැටළුවක්.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**දැනගැනීමටයි මේ වියදම් පිලිබදව විස්තර ඉදිරිපත් කලේ.සමහරු හිතනවා මේක ලාභයක් කියලා.සභාව තීන්දු කරනවා නම් අපි සංවර්ධන වැඩ වලට තියෙන මුදල් හරි යොදවලා ආදාහනාගාරය කටයුතු පවත්වගෙන යමු.මාසෙකට රු. 50000.00 විතර පාඩුයි.වාර්ෂිකව ලොකු වියදමක්.විමිනිය ,දොර,ආදියත් හදන්න ඕනි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිණි මහතා.

**පාඩු ලැබුවොත් මේ සේවය කඩා වැටේවි.විකුනන්නත් වෙයි.මගේ යෝජනාව සාධාරන මේ මුදල පියවෙන විදිහේ වත් මුදලක් අයකරන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා.

**මේ ආදාහනාගාරයේ වැඩ කරන සේවකයන් රජයේ ස්ථිර වැටුප් ලබන අයම දාන්න.අනියම් සේවකයින් දැමීමෙන් වියදම් වැඩියි. එක මසකට අතිකාලත් එක්ක රු.40000.00 විතර යනවා අනියම් සේවයට. විශාල ප්‍රමානයක් සේවකයින් රජයෙන් වැටුප් ලබන අය දැන් සභාවේ ඉන්නවා.ප්‍රමානවත් වැඩක් නැතුව.මේ අයව කලමනාකරනය කරලා සේවයේ යොදවන්න.තවත් මදිනම් රජයෙන් පඩි ලබන සේවකයින් තවත් ගෙන්න ගන්න.වියදම් අඩුකරන්න.එසේම විදුලිය සෝලා වගේ බිල අඩු ඒවා දමන්න.ජනතාව මත දැඩි බරක් පැටවීම අනවශ්‍ය දෙයක්.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**මම මල දවසක ආදාහනාගාරයේ දමන්න එපා.එතන ඉතාම අප්‍රසන්න තැනක් වෙලා.ඊලි පාලම් ඉතාම ජරා ජීර්න වෙලා.මුදල් අයකලාට නඩත්තුවක් වෙලා නෑ.ඉතාමත් ප්‍රසන්නව තිබිය යුතු ස්ථානයක්.නඩත්තුව අවමයි.කිසිදු ගෞරවනීය තත්වයක් නෑ.අධීක්ෂනයක් නෑ.පිටින් ගේන ආදාහන වලට පමනක් යම් මුදලක් වැඩිකරන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා.

**හයිඩ්‍රාමනි ආයතනයට කියලා කොඩි ටිකක් මහගන්න ඉල්ලීම් කරන්න.කරලා දෙයි. මේවා පිලිබඳ සොයා බලන්න.මිල වැඩිකරනවාට එකඟ නෑ.සේවා පහසුකම් අඩුයි. මේ තියෙන මුදල ගැසට් කරන්න.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**අළුතෙන් වීදිලාම්පු පහකුත් දැම්මා.කොඩි හා මෘතදේහ තැබීමට ස්ටෑන්ඩ් එකක් ගන්න ඕනි.මෙම බල ප්‍රදේශය ඇතුලත ආදාහනවලට දැනට තියෙන මුදලවන රු.10000.00 හා බාහිරින් ගේන ආදාහන සඳහා 11500.00 ලෙස ගැසට් කරමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා.

**කොළඹ තියෙනවා ස්ටෑන්ඩ් ඒ ට්‍රොලිය ස්වයංක්‍රියව මෘත දේහය සහිත පෙට්ටිය ආදාහන ස්ථානයට ඔසවා තබනවා.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ යෝජනාව අනුව

කුරුවිට ප්‍රාදේශීය සභාවේ පුස්සැල්ල ආදාහනාගාරයේ ආදාහන ගාස්තු 2023 වර්ෂය සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමටත් මෙම කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත ආදාහන වලට දැනට අයකරන ගාස්තුව වන රු.10000.00 හා බාහිරින් ගේන ආදාහන සඳහා 11500.00 ලෙස ගාස්තු සංශෝධනය කර 2023 වර්ෂය සඳහා ගැසට්කිරිමටත් මහා සභා අනුමැතිය ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx

05-18.අඩවිකන්ද ත්‍රි රෝද රථ සංගමය ලියාපදිංචිකරගැනීම සම්බන්ධව එම සංගමය මගින් ඉදිරිපත්කර ඇති ඉල්ලීම සම්බන්ධ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

අඩවිකන්ද සුමිතුරු ත්‍රි රෝද රථ සංගමය ලියාපදිංචිකිරීමට අවශ්‍ය පියවර ගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.අදාල අතුරුව්‍යවස්ථා අනුව නීත්‍යානුකූලව කටයුතු කරන්න.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**
අඩවිකන්ද ත්‍රි රෝද රථ සංගමය මගින් මෙම ඉල්ලීම සිදුකර ඇත්තේ.මෙම දංගමය ක්‍රියාත්මක තත්වයේ පවතින බවට ග්‍රාම නිලධාරී හා ප්‍රාදේශීය ලේකම් ද වාර්තා කර ඇත.සංගමයේ කාමලේඛනය හා වාර්තා පිටපත් ඇතුළු විස්තර ඉදිරිපත්කර ඇත.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ හා යෝජනාව අනුව**

හා අඩවිකන්ද ත්‍රි රෝද රථ සංගමය ලියාපදිංචිකරගැනීම සම්බන්ධව එම සංගමය මගින් ඉදිරිපත්කර ඇති ඉල්ලීම අනුව අඩවිකන්ද සුමිතුරු ත්‍රි රෝද රථ සංගමය ලියාපදිංචිකිරීමට අවශ්‍ය පියවර ගැනීම ට **මහා සභා අනුමැතිය ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

## 2022.12.09 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 5-19 යටතේ වන සභා තීරනයේ උද්‍ධෘතය

05-19.කිරිඇල්ල පොදු වෙළදසැල භූමියේ ඇති ඊඩොට්කෝ සර්විස් ලංකා පුද්ගලික සමාගම විසින් ඉදිකර ඇති බහුකාර්ය විදුලි පහන් කනුවට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මගින් ලබාදී ඇති අනුමැතිය සම්බන්ධ යෝජනාව.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

කිරිඇල්ල පොදු වෙළදසැල භූමියේ ඇති ඊඩොට්කෝ සර්විස් ලංකා පුද්ගලික සමාගම විසින් ඉදිකර ඇති බහුකාර්ය විදුලි පහන් කනුවට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මගින් ලබාදී ඇති අනුමැතිය සම්බන්ධව මහා සභාවේ අනුමැතිය ලබා දීමටත් නීත්‍යානුකූලව ඉදිරි පියවර ගැනීමටත් යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**
එම යෝජනාව ස්ථිර කරමි

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

කිරිඇල්ල පොදු වෙළඳසැල භූමියේ ඇති ඊඩොට්කෝ සර්විස් ලංකා පුද්ගලික සමාගම විසින් ඉදිකර ඇති බහුකාර්ය විදුලි පහන් කනුව සඳහා විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබුන පසු නීත්‍යානුකූල ක්‍රමවේදය යටතේ කටයුතු කිරිම සඳහා 2022.02.14 මහා සභාවේ දී අනුමැතිය ලැබී ඇත.ඒ අනුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අංක TRC/NW/ID/DAP/071/2021-005 සහ 2021.06.29 දිනැති ලිපියෙන් එම අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_**ගරු **සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ යෝජනාව අනුව**

කිරිඇල්ල පොදු වෙළඳසැල භූමියේ ඇති ඊඩොට්කෝ සර්විස් ලංකා පුද්ගලික සමාගම විසින් ඉදිකර ඇති බහුකාර්ය විදුලි පහන් කනුවට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මගින් ලබාදී ඇති අනුමැතිය සම්බන්ධව මහා සභාවේ අනුමැතිය ලබා දීමටත් නිත්‍යානුකුලව ඉදිරි පියවර ගැනීමටත් **මහා සභා අනුමැතිය ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.12.09 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 5-19 යටතේ වන සභා තීරනයේ සත්‍ය උදෘතයක්බ ව සහතික කරමි.

එස්.එච්.ආර්. විරක්කොඩි,
ලේකම්,
**ප්‍රාදේශීය සභාව,**
**කුරුවිට .**

05-20. කුරුවිට **ප්‍රාදේශීය සභාවට අයත්** කිරිඇල්ල පොදු වෙළඳ සංකීර්නයේ ඉහල මහල වැඩ නිමවා ව්‍යාපාරික කටයුත්තක් සඳහා බදුපදනම යටතේ ලබාදෙන ලෙස කිරිඇල්ල, ඉඩංගොඩ පදිංචි ඒ.පී. ඉදුනිල් සමන් කුමාර මහතා විසින් සිදුකර ඇති ඉල්ලීම සම්බන්ධ යෝජනාව.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

කුරුවිට **ප්‍රාදේශීය සභාවට අයත්** කිරිඇල්ල පොදු වෙළඳ සංකීර්නයේ ඉහල මහල වැඩ නිමවා ව්‍යාපාරික කටයුත්තක් සඳහා බදුපදනම යටතේ ලබාදෙන ලෙස කිරිඇල්ල, ඉඩංගොඩ පදිංචි ඒ.පී. ඉදුනිල් සමන් කුමාර මහතා විසින් සිදුකර ඇති ඉල්ලීම සභා තීරනයක් ලබාදිම සඳහා යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

**ඇඟළුම් ආයතතනයක්.පහල මාලයයි හදලා තියෙන්නේ.ඉහල මහලේ.හදාගන්නත් කැමතිළු.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක එරන්ද මහතා.**
**බිම සකසලා නෑ.මස්කඩ මාළු කඩ පැත්තක.තාවකාලිකව පැත්තකට කරමු.කඩ විවෘත කරමු.උඩකැල්ලත් හදමු. ඒක රැස්වීම් ශාලාවට ඕනි.නවත්තලා තියෙන නඩ තුනත් හදන්න.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**
**ස්ලැබ් දාලා තෙවන මහල හදමුද?රැස්වීම් ශාලාවට.ඉල්ලීම අනුව එම මහල ලබාදීම සිදුකරන්න බෑ.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.
**Xxxxxxxxxxxxxxx**_ගරු **සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ යෝජනාව අනුව** හා කිරිඇල්ල, ඉඩංගොඩ පදිංචි ඒ.පී. ඉදුනිල් සමන් කුමාර මහතා විසින් සිදුකර ඇති ඉල්ලීම අනුව කුරුවිට **ප්‍රාදේශීය සභාවට අයත්** කිරිඇල්ල පොදු වෙළඳ සංකීර්නයේ ඉහල මහල වැඩ නිමවා ව්‍යාපාරික කටයුත්තක් සඳහා බදුපදනම යටතේ ලබාදීම සඳහා සභා අනුමැතිය ලබා නොදීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-21.කීරගල ,බද්දේලෑගොඩ මැද පාර අතුරුමාර්ගය අබලන්ව ඇති ස්ථාන පිලිසකර කර ගැනීම සඳහා ද්‍රව්‍ය ලබාදෙන ලෙස කීරගල එකමුතු ගොවි සංවිධානය මගින් සිදුකර ඇති ඉල්ලීම සම්බන්ධ යෝජනාව.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**
කීරගල ,බද්දේලෑගොඩ මැද පාර අතුරුමාර්ගය අබලන්ව ඇති ස්ථාන පිලිසකර කර ගැනීම සඳහා ද්‍රව්‍ය ලබාදෙන ලෙස කීරගල එකමුතු ගොවි සංවිධානය මගින් සිදුකර ඇති ඉල්ලීම ට සභා අනුමැතියක් ලබා දීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය.**
එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

**එම මාර්ගයේ අබලන්ව ඇති ස්ථාන ශ්‍රමදාන පදනමින් පිලිසකර කිරිමට සිමෙන්ති මිටි 10,ක් 4/3 ගල් ටිපර් ½ ක් වැලි ටිපර් ½ක් හා කොන්ක්‍රිට් ලැලි දිග අඩි 25ක් ඉල්ලා තියෙනවා.පවුල් 35ක් මෙම මාර්ගය පරිහරනය කරන අතර කීරගල/කීරගල උඩවත්ත අතුරු මාර්ගයකි.මේ සම්බන්ධයෙන් කාර්මික නිලධාරි වාර්තා ලබාගෙන අවශ්‍ය ද්‍රව්‍ය ලබාදීමට කටයුතු කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.
**Xxxxxxxxxxxxxxx**_ගරු **සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ යෝජනාව අනුව** කීරගල ,බද්දේලෑගොඩ මැද පාර අතුරුමාර්ගය අබලන්ව ඇති ස්ථාන පිලිසකර කර ගැනීම

සඳහා ද්‍රව්‍ය ලබාදෙන ලෙස කීරගල එකමුතු ගොවි සංවිධානය මගින් සිදුකර ඇති ඉල්ලීම සම්බන්ධව කාර්මික නිලධාරි වාර්තා ලබාගෙන **අවශ්‍ය ද්‍රව්‍ය ලබාදීමට** සහා අනුමැතිය ලබා දීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-22.කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් මාර්ග GIS තාක්ෂනය යටතේ සිතියම් ගත කිරීමේ කාර්යාලයිය කටයුතු සඳහා ලැප්ටොප් පරිඝනක යන්ත්‍රයක් මිලදි ගැනිමට කැඳවන ලද මිල ගනන් සම්බන්ධ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් මාර්ග GIS තාක්ෂනය යටතේ සිතියම් ගත කිරීමේ කාර්යාලයිය කටයුතු සඳහා ලැප්ටොප් පරිඝනක යන්ත්‍රයක් මිලදි ගැනීමට කැඳවන ලද මිල ගනන් පහත දැක්වෙන අතර මෙම මිල ගනන් පත් පළාත් පාලන ආයතන සඳහා තාක්ෂණික නිර්දේශයන් ලබාගැනීමට නම්කර ඇති තොරතුරු සන්නිවේදන තාක්ෂණික සහකාර නිළධාරි එච්. ඒ. ජී. සංකල්ප පේමදාස මයා වෙත ඉදිරිපත් කර ඔහුගේ නිර්දේශ ලබාගෙන සුදුසු ලැප්ටෝප් පරිගණක යන්ත්‍රයක් මිළ දී ගැනීමටත් ගෙවීම් කිරීමටත් යෝජනා කරමි.
අදාල මිල ගනන්

| **ආයතනය** | **මුදල** |
|---|---|
| Imago computers, 255 1/1, Bandaranayaka mawtha, Moragahayata, Rathnapura | 475000.00 |
| HK computer Solutions (Pvt )ltd, No 498,Weralupa Jauntion, Colombo Road, rathnapura. | 460000.00 |
| Blue carban (pvt) Ltd,No 757/5, Karapicha Road, Hidallana, Rathnapura. | 425900.00 |
| Onimtra High tech Solution,(pvt) ltd, No 278, Colombo Road, Moragahayata, Rathnapura | 418700.00 |

**ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

මෙම මිල ගනන්පත් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සපයා ඇති පිරිවිතර අනුව මිල ගනන් කැඳවා ඇති අතර එම පිරිවිතර වලට අනුව ඉහත කාර්ය සඳහා I, 7 ලැප්ටොප් පරිඝනක යන්ත්‍රයක් මිලදි ගන්නා ලෙසත් උපදෙස් දී ඇත.එසේම සියළු පළාත් පාලන ආයතන වල මෙම කටයුත්ත සඳහා මෙම පරිඝනක මිලදී ගෙන ඇත.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx**_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ **යෝජනාව අනුව** කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් මාර්ග GIS තාක්ෂනය යටතේ සිතියම් ගත කිරීමේ කාර්යාලයිය කටයුතු සඳහා ලැප්ටොප් පරිඝනක යන්ත්‍රයක් මිලදි ගැනීමට කැඳවන ලද මිල ගනන් ඉහත දැක්වෙන අතර මෙම මිල ගනන් පත් පළාත් පාලන ආයතන සඳහා තාක්ෂණික නිර්දේශයන් ලබාගැනීමට නම්කර ඇති තොරතුරු සන්නිවේදන තාක්ෂණික සහකාර

නිළධාරි එච්. ඒ. ජී. සංකල්ප පේමදාස මයා වෙත ඉදිරිපත් කර ඔහුගේ නිර්දේශ ලබාගෙන සුදුසු ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් මිළ දී ගැනීමටත් ගෙවීම් කිරීමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-23. කුරුවිට **ප්‍රාදේශීය සභාවට අයත් වාහන සඳහා 2022.10.15 සිට 22.10.30 දක්වා කාල පරාසයට අදාලව මිලදීගෙන ඇති ඉන්දන සඳහා රු.499665.00 ක් සී/ස කුරුවිට විවිධ සේවා සමූපකාර සමිතියට ගෙවීම සම්බන්ද යෝජනාව**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

කුරුවිට **ප්‍රාදේශීය සභාවට අයත් වාහන සඳහා 2022.10.15 සිට 22.10.30 දක්වා කාල පරාසයට අදාලව මිලදීගෙන ඇති ඉන්දන සඳහා රු.499665.00 ක් සී/ස කුරුවිට විවිධ සේවා සමූපකාර සමිතියට ගෙවීම ට යෝජනා කරමි.**

| වාහන අංකය | රියදුරු | ඉන්දන ලබා ගත් දිනය | ඇණවුම් අංකය | ඉන්දන ප්‍රමාණය | වර්ගය | වටිනාකම | මුලු වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| PF-7449 කැබ් රථය | නිමල් | 22.10.12 | 5301 | ලීටර් 50 | ඩීසල් | 21500.00 | |
| | | 22.10.15 | 5311 | ලීටර් 50 | ඩීසල් | 21500.00 | |
| | | 22.10.17 | 5312 | ලීටර් 50 | සුපිරි ඩීසල් | 25500.00 | |
| | | 22.10.20 | 5318 | ලීටර් 53 | ඩීසල් | 21995.00 | |
| | | 22.10.25 | 5329 | ලීටර් 50 | ඩීසල් | 20750.00 | |
| | | 22.10.26 | 5332 | ලීටර් 50 | ඩීසල් | 20750.00 | |
| | | 22.10.29 | 5338 | ලීටර් 50 | ඩීසල් | 20750.00 | 152745.00 |
| 59-9978 කැබ් රථය | නිලන්ත | 22.10.17 | 5315 | ලීටර් 31 | ඩීසල් | 13330.00 | |
| | | 22.10.21 | 5319 | ලීටර් 55 | ඩීසල් | 22825.00 | 36155.00 |
| ZA-5082 ජේ.සී.බී.යන්ත්‍රය | ඉන්දික | 22.10.24 | 5330 | ලීටර් 125 | ඩීසල් | 51875.00 | 51875.00 |
| HD-2538 ත්‍රිරෝද රථය | අනුර | 22.10.17 | 5309 | ලීටර් 5 | පෙට්‍රල් | 2050.00 | |
| | | 22.10.26 | 5331 | ලීටර් 7 | පෙට්‍රල් | 2590.00 | |
| | | 22.10.31 | 5337 | ලීටර් 5 | පෙට්‍රල් | 1850.00 | 6490.00 |
| YP-8405 ත්‍රිරෝද රථය | ප්‍රියන්ත | 22.10.14 | 5307 | ලීටර් 10 | සුපිරි ඩීසල් | 5100.00 | |
| | | 22.10.21 | 5322 | ලීටර් 10 | සුපිරි ඩීසල් | 5100.00 | 10200.00 |
| RE-2264 ට්‍රැක්ටරය | අජිත්(එල්ලා වල) | 22.10.15 | 5310 | ලීටර් 60 | ඩීසල් | 25800.00 | |
| | | 22.10.29 | 5339 | ලීටර් 60 | ඩීසල් | 24900.0 | 50700.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | 0 | |
| BHK-6283 මෝටර් බයික් | අජිත් | 22.10.20 | 5317 | ලීටර් 5 | පෙට්‍රල් | 1850.00 | |
| | | 22.10.25 | 5325 | ලීටර් 5 | පෙට්‍රල් | 1850.00 | |
| | | 22.10.28 | 5333 | ලීටර් 5 | පෙට්‍රල් | 1850.00 | 5550.00 |
| RD-9476 ට්‍රැක්ටරය | ක්‍රිස්ටෝපර් | 22.10.17 | 5308 | ලීටර් 35 | ඩීසල් | 15050.00 | |
| | | 22.10.20 | 5323 | ලීටර් 30 | ඩීසල් | 12450.00 | |
| | | 22.10.24 | 5324 | ලීටර් 30 | ඩීසල් | 12450.00 | |
| | | 22.10.28 | 5335 | ලීටර් 40 | ඩීසල් | 16600.00 | 56550.00 |
| RD-6457 ට්‍රැක්ටරය | උදිත | 22.10.15 | 5313 | ලීටර් 30 | ඩීසල් | 12900.00 | |
| | | 22.10.17 | 5314 | ලීටර් 20 | ඩීසල් | 8600.00 | |
| | | 22.10.21 | 5320 | ලීටර් 35 | ඩීසල් | 14525.00 | |
| | | 22.10.24 | 5328 | ලීටර් 30 | ඩීසල් | 12450.00 | |
| | | 22.10.28 | 5334 | ලීටර් 50 | ඩීසල් | 20750.00 | 69225.00 |
| RD-1646 ට්‍රැක්ටරය | අජිත් කුරුවිට | 22.10.17 | 5326 | ලීටර් 40 | ඩීසල් | 16600.00 | |
| | | 22.10.21 | 5327 | ලීටර් 40 | ඩීසල් | 16600.00 | |
| | | 22.10.25 | 5336 | ලීටර් 40 | ඩීසල් | 16600.00 | 49800.00 |
| ආහාර පනත | කුරුවිට | 22.10.18 | 5316 | ලීටර් 25 | ඩීසල් | 10375.00 | 10375.00 |
| එකතුව | | | | | | | **499665.00** |

<u>**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**</u> එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**මෙම ගෙවීම සඳහා 22.12.01 මුදල් කමිටු නිර්දේශ ලබාදී ඇත**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් වාහන සඳහා 2022.10.15 සිට 22.10.30 දක්වා කාල පරාසයට අදාලව මිලදීගෙන ඇති ඉන්දන සඳහා රු.499665.00 ක් සී/ස කුරුවිට විවිධ සේවා සමූපකාර සමිතියට ගෙවීම ට අනුමැතිය ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-24. කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් වාහන සඳහා **2022.11.01 සිට 22.11.15 දක්වා කාල පරාසයට අදාලව මිලදීගෙන ඇති ඉන්දන සඳහා රු.463265.00 ක් සී/ස කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතියට ගෙවීම සම්බන්ද යෝජනාව**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් වාහන සඳහා 2022.11.01 සිට 22.11.15 දක්වා කාල පරාසයට අදාලව මිලදීගෙන ඇති ඉන්දන සඳහා පහත සඳහන් පරිදි රු.463265.00 ක් සී/ස කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතියට ගෙවීමට යෝජනා කරමි.**

| වාහන අංකය | රියදුරු | ඉන්දන ලබා ගත් දිනය | ඇණවුම අංකය | ඉන්දන ප්‍රමාණය | වර්ගය | වටිනාකම | මුලු වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| PF-7449 කැබ් රථය | නිමල් | 22.11.01 | 5343 | ලීටර් 50 | සුපිරි ඩීසල් | 25500.00 | |
| | | 22.11.03 | 5350 | ලීටර් 50 | සුපිරි ඩීසල් | 25500.00 | |
| | | 22.11.07 | 5336 | ලීටර් 50 | ඩීසල් | 20750.00 | 71750.00 |
| 59-9978 කැබ් රථය | නිලන්ත | 22.11.01 | 5341 | ලීටර් 50 | සුපිරි ඩීසල් | 25500.00 | |
| | | 22.11.08 | 5360 | ලීටර් 50 | ඩීසල් | 20750.00 | 46250.00 |
| ZA-5082 ජේ.සී.බී.යන්ත්‍රය | ඉන්දික | 22.11.07 | 5364 | ලීටර්125 | ඩීසල් | 51875.00 | 51875.00 |
| HD-2538 ත්‍රිරෝද රථය | අනුර | 22.11.02 | 5348 | ලීටර් 07 | පෙට්‍රල් | 2590.00 | |
| | | 22.11.09 | 5361 | ලීටර් 07 | පෙට්‍රල් | 2590.00 | |
| | | 22.11.14 | 5369 | ලීටර් 07 | පෙට්‍රල් | 2590.00 | 7770.00 |
| YP-8405 ත්‍රිරෝද රථය | ප්‍රියන්ත | 22.10.31 | 5340 | ලීටර් 10 | ඩීසල් | 4150.00 | |
| | | 22.11.08 | 5355 | ලීටර් 10 | ඩීසල් | 4150.00 | |
| | | 22.11.10 | 5365 | ලීටර් 10 | ඩීසල් | 4150.00 | 12450.00 |
| RE-2264 ට්‍රැක්ටරය | අජිත්(එල්ලාවල) | 22.11.04 | 5352 | ලීටර් 35 | ඩීසල් | 14525.00 | |
| | | 22.11.09 | 5362 | ලීටර් 45 | ඩීසල් | 18675.00 | 33200.00 |
| BHK-6283 මෝටර් බයික් | අජිත් | 22.11.02 | 5344 | ලීටර් 05 | පෙට්‍රල් | 1850.00 | |
| | | 22.11.08 | 5357 | ලීටර් 05 | පෙට්‍රල් | 1850.00 | |
| | | 22.11.11 | 5367 | ලීටර් 05 | පෙට්‍රල් | 1850.00 | 5550.00 |
| තණකොළ මැෂිම | නන්දන | 22.11.03 | 5349 | ලීටර් 05 | පෙට්‍රල් | 1850.00 | 1850.00 |
| ආහාර පනත | කුරුවිට | 22.11.14 | 5371 | ලීටර් 25 | ඩීසල් | 10750.00 | 10750.00 |
| ආහාර පනත | කිරිඇල්ල | 22.11.14 | 5374 | ලීටර් 25 | සුපිරි ඩීසල් | 12750.00 | 12750.00 |
| RD-9476 ට්‍රැක්ටරය | ක්‍රිස්ටෝපර් | 22.11.02 | 5346 | ලීටර් 10 | සුපිරි ඩීසල් | 5100.00 | |
| | | 22.11.04 | 5351 | ලීටර් 43 | ඩීසල් | 17845.00 | |
| | | | | ලීටර් 01 | ඔයිල් | 1525.00 | |
| | | 22.11.09 | 5363 | ලීටර් 30 | ඩීසල් | 12450.00 | |
| | | 22.11.10 | 5366 | ලීටර් 30 | ඩීසල් | 12450.00 | |
| | | 22.11.14 | 5373 | ලීටර් 20 | ඩීසල් | 8600.00 | 57970.00 |
| RD-6457 ට්‍රැක්ටරය | උදිත | 22.11.02 | 5345 | ලීටර් 10 | සුපිරි ඩීසල් | 5100.00 | |
| | | 22.11.04 | 5354 | ලීටර් 55 | ඩීසල් | 22825.00 | |
| | | 22.11.08 | 5358 | ලීටර් 35 | ඩීසල් | 14525.00 | 61800.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 22.11.12 | 5372 | ලීටර් 45 | ඩීසල් | 19350.00 | |
| RD-1646 ට්‍රැක්ටරය | අජිත් | 22.11.01 | 5342 | ලීටර් 40 | ඩීසල් | 16600.00 | |
| | | 22.11.02 | 5347 | ලීටර් 10 | සුපිරි ඩීසල් | 5100.00 | |
| | | 22.11.04 | 5353 | ලීටර් 40 | ඩීසල් | 16600.00 | |
| | | 22.11.08 | 5359 | ලීටර් 40 | ඩීසල් | 16600.00 | |
| | | 22.11.10 | 5368 | ලීටර් 40 | ඩීසල් | 17200.00 | |
| | | 22.11.14 | 5375 | ලීටර් 40 | ඩීසල් | 17200.00 | 89300.00 |
| | | | | | | එකතුව | **463265.00** |

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**22.12.01** මුදල් කමිටු නිර්දේශ මෙම ගෙවීම සඳහා ලබාදී ඇත

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.
**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් වාහන සඳහා 2022.11.01 සිට 22.11.15 දක්වා කාල පරාසයට අදාලව මිලදීගෙන ඇති ඉන්දන සඳහා ඉහත සඳහන් පරිදි රු.463265.00 ක් සී/ස කුරුවිට විවිධ සේවා සමූපකාර සමිතියට ගෙවීමට** අනුමැතිය ලබා දීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-25. **කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාල සඳහා පොත් මිලදී ගැනිම වෙනුවෙන් රු.858332.00 ක් ප්‍රකාශන ආයතන වෙත ගෙවිම් කිරිම සම්බන්ද යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>
**කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාල සඳහා පොත් මිලදී ගැනිම වෙනුවෙන් රු.858332.00 ක් ප්‍රකාශන ආයතන වෙත නීත්‍යානුකූලව ගෙවිම් කිරිමට යෝජනා කරමි.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා**</u>

එම යෝජනාව ස්ථිර කරමි

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා.**</u>

**ධනවර්ධන මන්ත්‍රීතුමා කොපමන මුදලක පොත් දුන්නාද?**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

**ලක්ෂ දෙකක. මේ මුදල සභා අරමුදලෙන් අයවැයෙන් පුස්ථකාල පොත් සඳහා වෙන් කල මුදල්.පුස්තකාල 4 ටම.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාල සඳහා පොත් මිලදී ගැනිම වෙනුවෙන් රු.858332.00 ක් ප්‍රකාශන ආයතන වෙත නීත්‍යානුකුලව ගෙවීම් කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

## 05-26. ඇස්තමේන්තු

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

05-26-01 සිට 05-26- 09 දක්වා පහත ඇස්තමේන්තු අනුමත කිරීමටත් ප්‍රාදේශීය සභා අරමුදලින් සිදු කල නොහැකි කාර්යයන් සඳහා වන ඇස්තමේන්තු සඳහා අවශ්‍ය නීත්‍යානුකූල අනුමැතීන් ලබාගෙන කටයුතු කිරීමටත් යෝජනා කරමි.

**05-26-01.** අධිකාරියේ ගොරකඇල මාර්ගයේඅධිකාරිය බෝක්කුව අසල මාර්ගය වැසිජලයෙන් යටවීම වැලැක්විමට වැවේ සිට කළු ගඟ දක්වා ඇල සුද්ද කිරිම. **රු.600000.00**
(ගරු ප්‍රා.ස.ම.ජී.එම් ජයරත්න මහතා)

**05-26-02.** ජයවර්ධන මාවතේ ජයවර්ධන මහතාගේ නිවස අසල මාර්ගය කොන්ක්‍රිට්කිරිම(ගරුප්‍රාසම ලක්මාල් මහතා) **රු.600000.00**

**05-26-03.** කරපිංච පළාත් මාර්ගයේ සිට කැන්ද ලන්ද මාර්ගය කොන්ක්‍රිට් කිරිම ( ගරුප්‍රාසම ජනක විමලසිරි මහතා) **රු.600000.00**

**05-26-04.** කීරගලවත්ත ඉහලවත්ත මාර්ගය කොන්ක්‍රිට් කිරිම පහන් ගෙදර බෝධිය අසල( ගරුප්‍රාසමප්‍රේමා ගම්ලත් මිය.) **රු.400000.00**

**05-26-05.**කීරගල ඉහලවත්තේ මාර්ගයේ පෙට්ටිබෝක්කුව අත්වැට ඉදිකිරිම. ( ගරුප්‍රාසමප්‍රේමා ගම්ලත් මිය.) **රු.150000.00**

**05-26-06.** කිරිඇල්ල බි.සි.නිවාස මාර්ගය කොන්ක්‍රිට් කිරිම ( ගරුප්‍රාසම අසංක එරන්ද මහතා) **රු.600000.00**

**05-26-07.** කරුනාජීව මහතාගේ නිවස අසලමාර්ගය කොන්ක්‍රිට් කිරිම ( ගරුප්‍රාසම ජීවන් රනතුංග මහතා) **රු.510000.00**

**05-26-08.** නැනසල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරනය කිරිම. රු.700000.00( ගරුප්‍රාසම උප සභාපති අනිල් ලියනගේ මහතා)

**05-26-09.** පාතගම දුම්මලේ ගොඩ මංජුල මහතාගේ නිවස අසල සිට උපාලි මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රිට් කිරිම
( ගරුප්‍රාසම දිප්ති චන්දන මහතා) රු.600000.00

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දේවින්ද කුමාර මහතා.

යම් යෝජනාවක ගැටළුවක් පිලිබඳ කතා කල හැකිද?

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

කතා කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දේවින්ද කුමාර මහතා.

පැරඩයිස්නව ජනපදය ප්‍රජා ශාලාව මාර්ගය. මේ පාර සම්බින්ධව ගැටළුවක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රුවන් අශෝක මහතා.

අඩි 120 මුළු දිග.මේක කාර්මික නිලධාරි දන්නවා. කරන්න තියෙන පාරක්.මේ පාර කරලා ඉවරයි.මුදල් ගත්තේ නෑ. මුදල් ගැනිමට දැම්මේ .අද නෙමේ යෝජනා කලේ .2021.නව රේට් අනුවයි කලේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දේවින්ද කුමාර මහතා.

ඒ තොරතුරු අවශ්‍යයි.මේ මුදල් ගෙවිමට මම විරුද්ධයි.පැරඩයිස් නවජනපදය ප්‍රජා ශාලාවට යන පාර කොන්ක්‍රිට් කිරිම සම්බන්දව. මේ පාර කරලා ඉවර එකක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රුවන් අශෝක මහතා.

මේ කරලා අවසානේ මුදල් ඉල්ලන්නේ.ටි.ඕ.මිස් දන්නවා.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

මේ කර්මාන්තය කරලා ඉවරද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රුවන් අශෝක මහතා.

අඩි 160 න් 60ක් කරලා.මේ ඉතුරු ටික.කොන්ත්‍රාත් කරුටයි මේ ගැටළුව.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දේවින්ද කුමාර මහතා.

කරලා ඉවර වෙලා කරන යෝජනා මොනවද?නිලධාරින් මේ ගැන දන්නවාද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා.
**කාර්මික නිලධාරි දාන්න කි◌වා.සල්ලි ගෙවලා නෑ.ගෙව්වත් නැතත් මේ වැඩය නිම කරලා.**

**මේ අවස්ථාවේ සභාවේ දැඩි ගෝෂා පැවතිනි.**
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-
**වාර්තා අරගෙනයි මේවා සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කරන්නේ.අදාල නිලධාරින්ගෙන් වාර්තා ගන්නවා.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව**
05-26-1 සිට 05-26-09 දක්වා ඉහත ඇස්තමේන්තු අනුමත කිරීමටත් අවශ්‍ය අවස්ථාවන්හිදි ඇස්තමේන්තු සම්බන්ධව නැවත නිලධාරි වාර්තා ලබාගෙන ඉදිරි කටයුතු නීත්‍යානුකූලව සිදු කිරිමටත් ප්‍රාදේශීය සභා අරමුදලින් සිදු කල නොහැකි කාර්යයන් සඳහා වන ඇස්තමේන්තු සදහා අවශ්‍ය නීත්‍යානුකූල අනුමැතීන් ලබාගෙන කටයුතු කිරීමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.12.09 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-27 හි උද්‍ධෘතය.

**05-27.** කුරුවිට ප්‍රාදේශීය සභාවේ **2023 වර්ෂයේ විගනන කමිටු ව පත්කිරිම හා කමිටුව පැවැත්විමට දිනයන් සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව.**
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවේ විගණන හා කළමණාකරන කමිටු පිහිටුවීම සඳහා නිලධාරීන් පත් කිරීමට අවශ්‍ය වන අතර එම විගනන නිලධාරීන් පත් කිරිමටත් එම කමිටුව පවත්වන දිනයන් අනුමත කර ගැනීමටත් යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා

**ඒ අනුව කමිටු නිලධාරීන් ලෙස ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා,ලේකම් එස්.එච්.ආර්. වීරක්කොඩි මිය,ගිණුම් නිලධාරී නිසංසලා හිටිහාමු මිය,විෂයනිලධාරි රංගිකා දිල්හානි මිය හා අංශ ප්‍රධානීන් ද මෙම කමිටුවේ 1 කාර්තුව කමිටුව 2023.03.16 දිනද 2 කාර්තුව කමිටුව 2023.06.15 දිනද 3 කාර්තුව කමිටුව 2023.09.21 දිනද 4 කාර්තුව 2023.12.21 දිනද පැවැත්විමට ද කටයුතු කරමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

විගනන වාර්තා සභාවට දමන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව 2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවේ විගණන හා කළමණාකරන කමිටු පිහිටුවීම සඳහා නිලධාරීන් ලෙස ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා,ලේකම් එස්.එච්.ආර්. වීරක්කොඩි මිය,ගිණුම් නිලධාරී නිසංසලා හිටිහාමු මිය,විෂයනිලධාරි රංගිකා දිල්හානි මිය හා අංශ ප්‍රධානීන් ද මෙම කමිටුවේ 1 කාර්තුව කමිටුව 2023.03.16 දිනද 2 කාර්තුව කමිටුව 2023.06.15 දිනද 3 කාර්තුව කමිටුව 2023.09.21 දිනද 4 කාර්තුව 2023.12.21 දිනද පැවැත්විමට ද ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-28.කුරුවිට තැඹිලියන මාර්ගයට ABC දැමීම හා පුස්සැල්ල නෙළුගොල්ල මාර්ගයට ගල් පස් දැමීම ප්‍රවාහනය වෙනුවෙන් මුදල් නොගෙවිම සම්බන්ධව රියදුරු චමින්ද කුමාර මයා විසින් ඉදිරිපත්කර ඇති ඉල්ලීම් ලිපිය සම්බන්ධ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**කුරුවිට තැඹිලියන මාර්ගයට ABC දැමීම හා පුස්සැල්ල නෙළුගොල්ල මාර්ගයට ගල් පස් දැමීම ප්‍රවාහනය වෙනුවෙන් මුදල් නොගෙවිම සම්බන්ධව රියදුරු චමින්ද කුමාර මයා විසින් ඉදිරිපත්කර ඇති ඉල්ලීම සඳහා මහා සභා තීරනයක් ගැනීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**කුරුවිට තැඹිලියන මාර්ගයට ABC දැමීම හා පුස්සැල්ල නෙළුගොල්ල මාර්ගයට ගල් පස් දැමීම මම කියලා සිදු කලේ.මේ සම්බන්ධව 2021 දි මුදල් කමිටුවටත් යොමුකලා. තාම ගෙවිම් කටයුතු නැ.පාරට ගල් පස් දානකොට කාර්මික නිලධාරි අධීක්ෂනය කලා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා.**

**සභා අනුමැතිය අරගෙන කල කර්මාන්තයක් නම් කාර්මික නිලධාරි වාර්තා අරගෙන ගෙවීම් කරන්න.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා.**

**තොරතුරු අරන් ඉදිරි කටයුතු කරන්න.ලේකම්තුමිය මේ පිලිබඳ කරුනු සොයා බලා ඉදිරි පියවරගන්න.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

**මමත් සෝමරත්න මන්ත්‍රිතුමත් සාක්ෂි.මේ කටයුත්ත කලා.මුදල් කමිටුවෙත් මේ පිලිබඳ කතාකලා.නිර්දේශ ගත්තා.ග්‍රාම නිලධාරි වාර්තාත් ඕනිනම් ඉදිරිපත්කල හැකියි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා.**
**එම සාක්ෂි පමනක් මදි. ශිරන්ති මිස් නම් ඒකාලේ අධීක්ෂනය කලේ වාර්තා අරන් කටයුතු කරන්න.**
**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**
**ඒකාලෙම ගෙව්වේ නැත්තේ ඇයි?මුදලකමිටු තිරනයත් ඇති.කාර්මික නිලධාරි නිර්දේශත් අරන් නීත්‍යානුකූලව ගෙවිම් කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ යෝජනාව අනුව හා**

**කුරුවිට තැඹිලියන මාර්ගයට ABC දැමිම හා පුස්සැල්ල නෙළුගොල්ල මාර්ගයට ගල් පස් දැමීම ප්‍රවාහනය වෙනුවෙන් මුදල් නොගෙවිම සම්බන්ධව රියදුරු චමින්ද කුමාර මයා විසින් ඉදිරිපත්කර ඇති ඉල්ලීම් ලිපිය අනුව කුරුවිට තැඹිලියන මාර්ගයට ABC දැමිම හා පුස්සැල්ල නෙළුගොල්ල මාර්ගයට ගල් පස් දැමීම ප්‍රවාහනය වෙනුවෙන් මුදල් ගෙවීම සඳහා කාර්මික නිලධාරි නිර්දේශ හා අනෙකුත් තොරතුරුලබාගෙන නීත්‍යානුකූලව ගෙවීම් කටයුතු සිදුකිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-29.මෙනේරිපිටිය මැල්වත්ත මාර්ගයේ විසල් ජලයෝජනා ක්‍රමයේ කටයුතු වලදි තම නිවස අසල මාර්ගය කොටස කැඩීයාම හේතුවෙන් ඒ සඳහා පැතිබැම්මක් සාදාදෙන ලෙස පි.එච්.ජයසිංහ මයා විසින් ඉදිරිපත්කර ඇති ඉල්ලිම් ලිපිය සම්බන්ධ යෝජනාව.**
**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

**මෙනේරිපිටිය මැල්වත්ත මාර්ගයේ විසල් ජලයෝජනා ක්‍රමයේ කටයුතු වලදි තම නිවස අසල මාර්ගය කොටස කැඩීයාම හේතුවෙන් ඒ සඳහා පැතිබැම්මක් සාදාදෙන ලෙස පි.එච්.ජයසිංහ මයා විසින් ඉදිරිපත්කර ඇති ඉල්ලීම සඳහා මහා සභා තීරනයක් ගැනීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා.**
එම යෝජනාව ස්ථිර කරමි.
**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

**විසල් මුදල් වලින් කරවන්නේ.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ යෝජනාව අනුව හා මෙනේරිපිටිය මැල්වත්ත මාර්ගයේ විසල් ජලයෝජනා ක්‍රමයේ කටයුතු වලදී තම නිවස අසල මාර්ගය කොටස කැඩීයාම හේතුවෙන් ඒ සඳහා පැතිබැම්මක් සාදාදෙන ලෙස පී.එච්.ජයසිංහ මයා විසින් ඉදිරිපත්කර ඇති ඉල්ලීම් ලිපිය අනුව විසල් මුදල් යොදවා එම පැති බැම්ම සැකසීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-30. කුරුවිට ප්‍රාදේශීය සභාවේ සභා ක්‍රීඩාංගනයේ තණකොළ කැපීමට සුදුසු යන්ත්‍රයක්මිලදී ගැනීමට පිරිවිතර සකස්කිරිමට අදාලව තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කිරීම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**කුරුවිට ප්‍රාදේශීය සභාවේ සභා ක්‍රීඩාංගනයේ තණකොළ කැපීමට සුදුසු යන්ත්‍රයක්මිලදී ගැනීමට පිරිවිතර සකස්කිරිමට අදාලව තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කිරීම ට යෝජනා කරමි.**
<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා.</u>

මේවා සිදු නොවෙන වැඩ.තව මාස හයකටවත් බැරිවෙයි මැෂිමක් ගන්න.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

පළාත් පාලන කෙමසාරිස් විසින් මේ සම්බන්ධව අංක CLG/DE/2/2/1/6 හා 22.11.22 දිනැතිව ලිපියක් එවා තියෙනවා.ඒ අනුව
**කුරුවිට ප්‍රාදේශීය සභාවේ සභා ක්‍රීඩාංගනයේ තණකොළ කැපීමට සුදුසු යන්ත්‍රයක්මිලදී ගැනීමට පිරිවිතර සකස්කිරිමට අදාලව තාක්ෂණික ඇගයීම් කමිටුවට සාමාජිකයින් හතරදෙනෙකු නම් කර එවා ඇති අතර සුදුසු අනෙකුත් සාමාජිකයින් පත්කර මහා සභා අනුමැතිය ලබාගෙන හා පිරිවිතර සකස්කිරීමේ තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කරගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනලෙස දැනුම් දී ඇත. ඒ අනුව**

**1.ජී.එස්. අජිත් මහතා (සභාපති )-නි○○○○○○○○○○○○○○○○○○○යෝජ්‍ය අධ්‍යක්ෂ,ඉංජිනේරු පළාත් පාලන,පළාත් පාලන දෙපාර්තමේන්තුව, සබරගමු පළාත් සභාව.**
2.බී.ටී.ජේ. අබේසේකර මහතා(කමිටු සාමාජික) -ප්‍රධාන ගණකාධිකාරි ප්‍රධාන අමාත්‍යාංශය. **සබරගමු පළාත් සභාව.**
3.පී.එම්.ඊ. විජේසූරිය මහතා (කමිටු සාමාජික) - යාන්ත්‍රික ඉංජිනේරු,පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය.
කුරුවිට ප්‍රාදේශීය සභාවෙන් කමිටු සාමාජිකයින් ලෙස

4.කාර්මික නිලධාරී කේ.ඒ.සමන්ත මහේෂ් කොඩිකාර මයා සහ

5.කාර්මික නිලධාරී එස්.ඒ.අනොජ් මධුෂංක මහතා
පත්කරමු.සඳුදාට මේ කටයුත්ත කඩිනමින් සිදු කරන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ යෝජනාව අනුව**
**කුරුවිට ප්‍රාදේශීය සභාවේ සභා ක්‍රීඩාංගනයේ තණකොළ කැපීමට සුදුසු යන්ත්‍රයක්මිලදී ගැනිමට පිරිවිතර සකස්කිරිමට අදාලව තාක්ෂණික ඇගයිම් කමිටුව ඉහත නම් සඳහන් නිලධාරින් පස්දෙනාගෙන් සමන්විතව පත් කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-31**. **කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් වාහන සඳහා 2022.11.15 සිට 22.11.30 දක්වා කාල පරාසයට අදාලව මිලදීගෙන ඇති ඉන්දන සඳහා රු.561279.14 ක් සී/ස කුරුවිට විවිධ සේවා සමූපකාර සමිතියට ගෙවීම සම්බන්ද යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-
**කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් වාහන සඳහා 2022.11.15 සිට 22.11.30 දක්වා කාල පරාසයට අදාලව පහත සඳහන් පරිදි මිලදීගෙන ඇති ඉන්දන සඳහා රු.561279.14 ක් සී/ස කුරුවිට විවිධ සේවා සමූපකාර සමිතියට ගෙවීම ට යෝජනා කරමි.**

| වාහන අංකය | රියදුරු | ඉන්දන ලබා ගත් දිනය | ඇණවුම් අංකය | ඉන්දන ප්‍රමාණය | වර්ගය | වටිනාකම | මුලු වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| PF-7449 කැබ් රථය | නිමල් | 22.11.14 | 5370 | ලීටර් 50 | ඩීසල් | 21500.00 | |
| | | 22.11.16 | 5379 | ලීටර් 50 | සුපිරි ඩීසල් | 25500.00 | |
| | | 22.11.18 | 5385 | ලීටර් 50 | ඩීසල් | 21500.00 | |
| | | 22.11.21 | 5395 | ලීටර් 50 | සුපිරි ඩීසල් | 25500.00 | |
| | | 22.11.24 | 5402 | ලීටර් 70 | ඩීසල් | 30100.00 | |
| | | 22.11.27 | 5413 | ලීටර් 50 | ඩීසල් | 21500.00 | |
| | | 22.11.30 | 5414 | ලීටර් 50 | ඩීසල් | 21500.00 | 167100.00 |
| 59-9978 කැබ් රථය | නිලන්ත | 22.11.15 | 5376 | ලීටර් 55 | ඩීසල් | 23650.00 | |
| | | 22.11.20 | 5386 | ලීටර් 40 | ඩීසල් | 17200.00 | |
| | | 22.11.23 | 5399 | ලීටර් 20 | සුපිරි ඩීසල් | 10200.00 | |
| | | 22.11.24 | 5403 | ලීටර් 49 | ඩීසල් | 21070.00 | |
| | | 22.11.29 | 5411 | ලීටර් 40 | ඩීසල් | 17200.00 | 89320.00 |
| RD-1646 ට්‍රැක්ටරය | අජිත් | 22.11.21 | 5389 | ලීටර් 40 | ඩීසල් | 17200.00 | 17200.00 |
| BHK-6283 මෝටර් බයික් | අජිත් | 22.11.17 | 5381 | ලීටර් 5 | පෙට්‍රල් | 1850.00 | |
| | | 22.11.22 | 5393 | ලීටර් 5 | පෙට්‍රල් | 1850.00 | |
| | | 22.11.24 | 5404 | ලීටර් 5.26 | පෙට්‍රල් | 1946.94 | |
| | | 22.11.29 | 5409 | ලීටර් 5 | පෙට්‍රල් | 1850.00 | 7496.94 |
| RD-9476 ට්‍රැක්ටරය | ක්‍රිස්ටෝපර් | 22.11.16 | 5380 | ලීටර් 22 | ඩීසල් | 9460.00 | |
| | | 22.11.21 | 5387 | ලීටර් 40 | ඩීසල් | 17200.00 | |
| | | 22.11.23 | 5398 | ලීටර් 20 | ඩීසල් | 8600.00 | |
| | | 22.11.25 | 5406 | ලීටර් 30 | ඩීසල් | 12900.00 | |
| | | 22.11.28 | 5407 | ලීටර් 40 | ඩීසල් | 17200.00 | 65360.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ZA-5082 ජේ.සී.බී.යන්ත්‍රය | ඉන්දික | 22.11.21 | 5391 | ලීටර්125 | ඩීසල් | 53750.00 | 53750.00 |
| HD-2538 ත්‍රිරෝද රථය | අනුර | 22.11.17 | 5384 | ලීටර් 07 | පෙට්‍රල් | 2590.00 | |
| | | 22.11.21 | 5388 | ලීටර් 07 | පෙට්‍රල් | 2590.00 | |
| | | 22.11.24 | 5405 | ලීටර් 8.79 | පෙට්‍රල් | 3252.30 | 8432.30 |
| YP-8405 ත්‍රිරෝද රථය | ප්‍රියන්ත | 22.11.25 | 5378 | ලීටර් 10 | ඩීසල් | 4300.00 | |
| | | 22.11.20 | 5392 | ලීටර් 10 | ඩීසල් | 4300.00 | |
| | | 22.11.24 | 5401 | ලීටර් 7.38 | ඩීසල් | 3173.40 | 11773.40 |
| RE-2264 ට්‍රැක්ටරය | අජිත්(එල්ලාවල) | 22.11.18 | 5383 | ලීටර් 60 | ඩීසල් | 25800.00 | |
| | | 22.11.24 | 5397 | ලීටර් 57.55 | ඩීසල් | 24746.50 | 50546.50 |
| RD-6457 ට්‍රැක්ටරය | උදිත | 22.11.15 | 5377 | ලීටර් 20 | ඩීසල් | 8600.00 | |
| | | 22.11.17 | 5382 | ලීටර් 35 | ඩීසල් | 8600.00 | |
| | | 22.11.21 | 5390 | ලීටර් 35 | ඩීසල් | 15050.00 | |
| | | 22.11.22 | 5394 | ලීටර් 45 | ඩීසල් | 19350.00 | |
| | | 22.11.24 | 5400 | ලීටර් 20 | ඩීසල් | 8600.00 | |
| | | 22.11.28 | 5408 | ලීටර් 35 | ඩීසල් | 15050.00 | |
| | | 22.11.30 | 5415 | ලීටර් 35 | ඩීසල් | 15050.00 | 90300.00 |
| | | | | | | එකතුව | **561279.14** |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා.</u>
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් වාහන සඳහා 2022.11.15 සිට 22.11.30 දක්වා කාල පරාසයට අදාලව පහත සඳහන් පරිදි මිලදීගෙන ඇති ඉන්දන සඳහා රු.561279.14 ක් සී/ස කුරුවිට විවිධ සේවා සමූපකාර සමිතියට ගෙවීම ට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-32.කෘෂිකාර්මික කටයුතු සඳහා වලදූර රනබටේ මුකලාන ඉඩමෙන් පර්චස් 50 ක් කේ.ඩී.හේමචන්ද්‍ර කුමාරසිංහ මහතා වෙත දීර්ඝකාලීන බදු ලබාදීම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**කෘෂිකාර්මික කටයුතු සඳහා වලදූර රනබටේ මුකලාන ඉඩමෙන් පර්චස් 50 ක් කේ.ඩී.හේමචන්ද්‍ර කුමාරසිංහ මහතා වෙත දීර්ඝකාලීන බදු ලබාදීම සම්බන්ධව කුරුවිට ප්‍රාදේශීය ලේකම් විසින් මෙම සභාව වෙත යොමු කර ඇති ඉල්ලීම සඳහා මහා සභා අනුමැතියක් ලබාදීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

ඉඩම් කොමසාරිස් ජෙනරාල්ගේ චක්‍රලේඛ අංක 2008/04 විධිවිධාන ප්‍රකාරව වලදූර වසමේ පවත්වන ලද ඉඩම් කච්චේරියෙන් **කේ.ඩී.හේමචන්ද්‍ර කුමාරසිංහ මයා වෙත අ.ග.පි.329 හි ලොට් අංක 150 රනබටේ මුකලාන ඉඩමෙන් පර්චස් 50 ක් කෘෂිකාර්මික කටයුතු සඳහා දීර්ඝකාලීන බදු ලබාදිමට තීරනය වි ඇත.එම ඉඩම් කොටස බදු ලබා දීමෙන් නාගරික සංවර්දන සැලැස්මට බාධාවක් සිදුවන්නේද යන්න පිලිබඳව විමසා ඇත.මේ අනුව මෙම ඉඩම නාගරික සංවර්දන සැලැස්මට බාධාවක් සිදුවන්නේද යන්න පිලිබඳව කාර්මික නිලධාරිවාර්තාගෙන**
**පරික්ෂාකර අනුමැතියක් ලබාදීමට කටයුතු කරමු.**
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ යෝජනාව අනුව හා කුරුවිට ප්‍රාදේශීය ලේකම් විසින් මෙම සභාව වෙත යොමු කර ඇති ඉල්ලීම් ලිපිය අනුව කෘෂිකාර්මික කටයුතු සඳහා වලදූර රනබටේ මුකලාන ඉඩමෙන් පර්චස් 50 ක් කේ.ඩී.හේමචන්ද්‍ර කුමාරසිංහ මහතා වෙත දීර්ඝකාලීන බදු ලබාදිම සම්බන්ධව කාර්මික නිලධාරිවාර්තාගෙන පරික්ෂාකර අනුමැතිය ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-33. 83616 නඩුඅංකය යටතේ පැවති නඩුව සඳහා අතින් දරන ලද නිතිඥ ගාස්තු ප්‍රතිපූර්නය කිරිම පිලිබඳ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**83616 නඩුඅංකය යටතේ පැවති නඩුව සඳහා අතින් දරන ලද නිතිඥ ගාස්තු ප්‍රතිපූර්නය කිරිම ට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.විස්තර සොයාබලා ගෙවීම් කටයුතු සිදු කරන්න.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**83616 නඩුඅංකය යටතේඅයි.එස්.ඩබ්.ශ්‍රියානි මිය විසින් 1,2.3. විත්තිකරුවන් ලෙස ගරු ප්‍රාසම ආර්.සෝමරත්න මහා, මම ,හා කුරුවිට ප්‍රාදේශීය සභාව නම්කර 2014/2019 කාල වකවානුවේ රත්නපුර මහේස්ත්‍රාත් අධිකරනයේ පැවරුවා. එම නඩු කටයුතු අතරවාරයේ එවකට සභාවේ වාතාවරනය හේතුවෙන් නඩු කටයුතු සඳහා මූල්‍ය වියදම් -නඩු ගාස්තු මා විසින් දැරුවා.නඩු ඉවර උනාම ප්‍රතිපූර්නය කරන්නම් කීවා.ඒ වියදම් දැරුවේ නීතිඥ මහින්ද මතුගම මහතා වෙනුවෙන්.ඒ කාලෙට අදාල ගාස්තු ඉල්ලන්නේ.ඒ නිතිඥමහතාගෙන් වාර්තා අරගෙන ගෙවන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ යෝජනාව අනුව 83616 නඩුඅංකය යටතේ පැවති නඩුව සඳහා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා**

**අතින් දරන ලද නීතිඥ ශාස්තු විස්තර ලබාගෙන නීත්‍යානුකූලව ප්‍රතිපූර්නය කිරිම ට අනුමැතිය ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**<u>05-34.</u>2022 වර්ෂය වෙනුවෙන් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද වරිපනම් විරෝධතා පරික්ෂනයේදි ගන්නා ලද තීරන සහිත වාර්තාව සඳහා මහා සභා අනුමැතිය**
**ලබා දීම සම්බන්ධ යෝජනාව.**
**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>**

**2022 වර්ෂය වෙනුවෙන් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද වරිපනම් විරෝධතා පරික්ෂනයේදි ගන්නා ලද තීරන සහිතඅංක** RT/307/RO/2022 **2022.11.30 දිනැති ලිපිය සමග ඉදිරිපත්කර ඇති තක්සේරු විරෝධතා -2022 වාර්තාව (ඇමුණුම -02) මහා සභා අනුමැතිය ලබා දීම සඳහා යෝජනා කරමි.මෙම වාර්තාව සභාගත කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>**

**2022 වර්ෂය වෙනුවෙන් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද වරිපනම් විරෝධතා පරික්ෂනයේදි ගන්නා ලද තීරන සනාථ කර අංක** RT/307/RO/2022 **හා 2022.11.30 දිනැතිව වාර්තාව ඉදිරිපත්කර ඇත.ඒ අනුව කටයුතු කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා ගේ යෝජනාව අනුව හා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ 2022.11.30 දිනැති ලිපිය අනුව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද වරිපනම් විරෝධතා පරික්ෂනයේදි ගන්නා ලද තීරන සහිත සහිතඅංක** RT/307/RO/2022 **2022.11.30 දිනැති ලිපිය සමග ඉදිරිපත්කර ඇති තක්සේරු විරෝධතා -2022 වාර්තාව (ඇමුණුම -02) සඳහා මහා සභා අනුමැතිය ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**<u>06.කාරක සභාවල වාර්තා</u>**

<u>කාරක සභාවල වාර්තා</u>

06-01 මුදල් කමිටු වාර්තාව(2022.12.01

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

22.12.01 දින **මුදල් කමිටු වාර්තාව** සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් **මහා** සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.කේ.එම්.එස්.එස් ධනවර්ධන මහතා :-
එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා විසින් මුදල් කමිටුවේ අංක 200 යටතේ වාහන රක්ෂනය කිරිම සම්බන්ධයෙන් විමසු අතර මෙහිදි විවිධ රක්ෂන ආයතන වලින් විමසිම් කර මිල ගනන් ගෙන තරඟකාරිත්වය ඇති වන පරිදි සභාවට වැඩි ප්‍රතිලාභ ලැබෙන පරිදි ඉදිරියේදි වාහන රක්ෂන කටයුතු සිදු කිරිමට සාකච්ජා විය.එසේම අංක 207 යටතේ කරුනු විමසු අතර පී.බී.ඉන්ද්‍රාණි මිය විසින් නිවසට යන මාර්ගය මැනුම්කිරිම සම්බන්ධයෙන් එම මහත්මිය විසින් දරන මැනුම් වැයබරක් බවට නිරාකරනය විය.**
අංක 209 බෝපත්ඇල්ල රක්ෂිතයේ වාර්ෂික බදු ගෙවීම නීත්‍යානුකූල ගෙවිමක් බවට කරුනු දක්වන ලදි.එසේම අංක 210 ජීඅයිඑස්.තාක්ෂනය යටතේ සිතියම්ගත කිරිම පුහුනු වැඩසටහන සඳහා රු.30937.00 වැයබර දැරීම නීත්‍යානුකූල ගෙවිමක් බවට කරුනු දක්වන ලදි.අංක 211 8020 ටැක්ටර් රථය අළුත්වැඩියාව සම්බන්ධව විමසන අතර කාර්මික කමිටුවේ නිර්දේශ ලබා දි ඇත්තේ වෙනත් අළුත්වැඩියාවන් සඳහා බව දන්වන ලදි.මෙම රෙපෙයාර් සඳහා ද්‍රව්‍ය මිලදීගෙන ඇති අතර ඒ සඳහා බිල ඉදිරිපත්කර ඇති බව දන්වන ලදී.එසේම ඉන්දන සම්බන්ධ වගුවට වාහනයේ මිටරය සම්බන්ධ දත්තද ඇතුලත් කරන ලෙස දන්වන ලදී.
අංක 225 යටතේ වන වාහන සඳහා රක්ෂන ගාස්තු ඉල්ලා ඇති අතර ගාස්තු ගෙවා නොමැති බව සාකච්ජා වූ අතර අතර මෙම වාහන මෙපමන කලක් ගරාජ් කර තිබූ බව දන්වා තබන ලෙසත් **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා විසින් දන්වන ලදී.**

අංක 219 සම්බන්ධව සාකච්ජා කොට ගැටළු නිරාකරනය විය.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

> **Xxxxxxxxxxxxxxx** 22.12.01 දින **වන දින මුදල් කමිටු වාර්තාව** සංශෝධනයන්ට යටත්ව **සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

06-02 කාර්මික කමිටු වාර්තාව
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**22.12.05 දිනැති කාර්මික කමිටු වාර්තාව** සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් **මහා** සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.කේ.එම්.එස්.එස්.ධනවර්ධන මහතා :-
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

ගරු සභාපතිතුමාගේ කැබ්රථයේ ලීටර් 50 ද වදින්නේ?.සමහර ඒවා 50 යි පුළුවන්. ඉවර වෙන්නේ අන්තිම බින්දුවට.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

ටැංකියට 50ට වඩා දාන්න පුළුවන්.කසල අංගනයේ ජේ.සී.බී.එක කැඩිලා.හදන්න දැම්මා.වැඩ කොටසක් තියෙනවා.ඒකේ සිදු කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

ඒ ජේ.සි.බි එක විකුනන්න.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

මහින්ද මන්ත්‍රි තුමාත් රන්ජන් මන්ත්‍රිතුමාත් මේක පරික්ෂා කලා.පැහැදිලිකරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා :-**

05.27 දා හයිඩ්‍රොලික් මාරු කරලා.නමුත් නිසි තාක්ෂනය භාවිතා කරලා නෑ.කාර්මික නිලධාරිත් ඒ අවස්ථාවේ ඉදලා තියෙනවා.ජැක්වල ඔයිල් වැක්කෙරෙනවා.ඔයිල් සම්බන්ධ කටයුතු කිසි ලෙස කෙරිලා නෑ.ආම් එක පුපුරලා.ජැක් සුද්ද කරන්න වෙලා.ලක්ෂ 6ක් විතර යයි.දිරපු කොටස් තියෙනවා.මන්ඩි බකට් එකෙත් ගැටළු.නිසි ලෙස මේ නඩත්තුව කෙරිලා නෑ.ඔයිල් අඩුවෙන් දුවලා.ලික් හදන්න වෙනවා.මේ හයිඩ්‍රොලික් දැන් ගාන වැඩියි.කලින් හරියට කරලා නෑ.දැන් බාස් උන්නැහේ හරියට කරයි.ටි.ඕ.ඉදලත් වැඩේ හරියට කෙරිලා නෑ.කනගාටුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

ටි.ඕ. කියන්නේ මෝටර් මැකනික් නෙමෙයි.ඒ අය ඒවා දන්නේ නෑ. ඔය ජේ.සිබි.එක තරහා කාරයෙකුට දෙන්න.ඒ තරම් වැඩක් නෑ.වියදම් හැමදාම.අපි ස්කැවේටරයක් ගමු.හැමදාම කිච්චා.ටයර් වත් විකුනන්නවත් බෑ.කර්මාන්තපුරේ න් ජැක් ගහලා හරි දුවමු ඒකට.රු.50000 ක් විතර යයි.මේ ජේ.සිබිඑකේ වැඩවලදි ආයේ ඔය වැරදි වෙන්න ඉඩ තියන්න එපා.නිවැරදි අධීක්ෂනයක් කරන්න.මන්ත්‍රීතුමාත් මේ හයිඩ්‍රොලික් මාරු කරනකොට සහභාගි කරගන්න.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

ස්කැවේටර් එකක් ගත්තොත් හොඳයි.ලොකු මුදලක් යනවා.දින 10 ට ලොකු මුදලක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේ කුමාර මහතා :-**

රියදුරු හරියට වාහනය නඩත්තු කරලා නෑ.වාහනයට ග්‍රීස්වත් ගහලා නෑ.පුහුනුවක් හරි එයාට දෙන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx 22.12.05 දිනැති කාර්මික කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

06-03.කුඩානගර ජල සම්පාදන කමිටු වාර්තා -22.11.03 හා 22.11.18

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

මෙම වාර්තා ඉදිරි සභාවට ඉදිරිපත්කිරිමට නියමිතයි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

අද ජල මෝටරය ගෙනාවද? අනුමැතීන් තියද?

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

ජල සම්පාදන මන්ඩලයේ අනුමැතිය තියෙනවා.මේක ගෙනාවට පස්සේ මේ ඉන්න අය කියනවා ඒක පරනයි කියලා.ලංකා ටෙක් එකෙන් ගෙනාවේ.වයර් එකක් ටිකක් පරනයි වගේ ඒනිසා රිටර්න් කලා.නැවත භාර දුන්නා.ලී පෙට්ටිය නෑ.තදවෙලා වයර් කැඩිලද දන්නෑ.කටින් වතුර ලීක් වෙනවළු.හර්ෂට කතා කලා.එයා කියනවා වසර ගානක් ගබඩා කරලා තිබිලා කුනු ගෑවිලා ඇතිළු.පෙට්ටි වේයෝ කාලළු.හර්ෂ රාජපුර මැනේජර් කිව්වා සල්ලිත් ආපිට ගෙවනවා කීවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

ගිය වතාවේ සිදුඋන දේමයි. වෙලා තියෙන්නේ.වැඩ කරන තුන්දෙනා කැමති නෑ සභාවේන් මේ වැඬේ කෙරෙනවට.මේ කානු කපන්න ගත්ත අය.දැන් වතුර ගැහුවට මිනිස්සුන්ට වදින්නෑ.ඒ 4 දෙනා එක්ක මේක කරන්න බෑ.ඒ අය හිතුවේ වෝටර් බෝඩ් එකට යන්න.ගේන මෝටරය පරිස්සම් කරන්න.කැලි මාරුකල හැකියි.මටත් කීවනේ පරන එකක් කියලා. මේ මෝටර් බිම දාලයි තියෙන්නේ.පරන වගේ.සමහර විට පරන වෙන්නත් ඇති.මේ සේවකයෝ එක්ක බෑ. වැඬේ කරනවට කැමති නෑ.ජයලතුත් දන්නවා වතුර නතර කරලා,මැටි හිර කරලා,ඒකාලේ මුර දාලයි වැඩ කෙරෙව්වේ.රු.2000 ගානේ ගෙව්වා.පෙත්සම් ගහන්නෙත් ඒ අයමයි.මම නිකා හිටියේ ඒකයි.ඒ අයට මානසික තත්වය වැඩි පඩියකට වෝටර් බෝඩ් එකට යන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-

මට මේ දැඩි ජනතා ගැටළුව වතුර.ඒ නිසා බලපු මෝටරය නෙමේ නම් ගෙනත් තියෙන්නේ නම් හරි එක ගේන්න.මුදල් දීලා ගේන්න වෙන්නේ.එය ඉංජිනේරු ගෙන්වලා බලවන්න.අනුමත කරන්නේ ඒ අය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා :-

නගරේ ලොකුම ගැටළුව.වැසිකිලි, වතුර.කුරුවිට නගරෙට සාධාරනය කරන්න දෙන්නැත්නම් වැඩක් නෑ.මංගල මන්ත්‍රීතුමා කියන විදිහට මුද දාලා වතුර දීලා. එතකොට ටැංකියට වතුර වදිනවා.එජ්.සී.අයි.ඩී. යන්න බෑ.ජනතාවට වතුර දෙන්න අනුමත කලා.යෝජනා කලා.මේක විනිවිදව කරන්න.ගිහින් බලලා ගේන්න.මෝටරය පරනයි කියන්නේ ජල ව්‍යාපෘතියේ අය.

අපිත් යන්න ඕනි.රු. 5000 ක් වැඩිකලා. තත්වය මේක නම් සත 5ක් වැඩිකරන්න එපා.ජනවාරි වෙනකොට. වතුර දෙන්න බෑ.බරපතල තත්වයක්.එජ්.සීඅයිඩ් නොයන්න යි වැඩ කලේ. මේ ප්‍රශ්නෙට වඩා ගැටළුවක් ජල සේවකයෝ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-

අපි වෙනම පුද්ගලයෝ දාලත් කතා කෙරෙව්වා.සාධාරන මුදලක් ඒක.අපි කව්රු හරි යමු.අක්‍රමිකතා වෙන්න දෙන්න බෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

අපිත් කමිටුවේ සාකච්චා කරලා මෝටරයක් ගේන්න දැඩි අවශ්‍යතාවක් නිසා නීත්‍යානුකූලව ගෙනාවා. නමුත් ගෙනා ගමන් කීවා ඒ මෝටරයත් පරනයි කියලා.මේ මෝටරයටත් උනේ ඒක.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා :-**

භාවිතා කල පරන එකක් නම් මලකඩ ඇති.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා :-**

එදා අපි අත්සන් කලා මේ මෝටරය මිලදී ගන්න කියලා.හැමදාම වතුර නැකියලා කැගහන්නේ.ඒ නිසයි අත්සන් කලේ. මෙහෙම උනාම විශ්වාසය නැතිව යනවා.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

මේ කතාව සඳහා කාරක සභාවක් වෙන්න.
ඒ අනුව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතාගේ හා ගරු උපසභාපති තුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් යුතුව මහා සභාව කාරක සභාවක් බවට පත්විය.ඒ අනුව මෙම ජල මෝටරය සම්බන්ධයෙන් සාකච්චා විය.එසේම ජල මෝටරයක් ගැනීමේදි ඒ සඳහා ඉංජිනේරු වාර්තාවක් අනිවාර්යෙන් ලබා ගැනිමට සාකච්ඡා විය.එසේම කොන්ත්‍රාත් පදනමට ඉංජිනේරු වරයෙකුට යම් දිමනාවක් ලබාදි මෙම මෝටරය අධීක්ෂන කටයුතු සඳහා මාසතුනකට ඉංජිනේරු වරයෙකුගේ සහාය ගැනිමටද සාකච්ඡා විය.සතියකට වරක් මෙය අධීක්ෂනය කිරීමෙන් සිදුවිය හැකි ගැටළු රැසක් අවම කරගතහැකිබව සාකච්චා විය.**

## 07 ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ

07-01.2022 ඔක්තොම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

2022 ඔක්තොම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනා කරමි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිණි දයා කස්තුරි මිය-**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

> **Xxxxxxxxxxxxxxx**2022 ඔක්තොම්බර් මස **මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ආදායම් ඇස්තමේන්තුව,ඒකාබද්ධ වැය සාරාංශය, වියදම් ඇස්තමේන්තුව, ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

07-02. 2022 නොවැම්බර් මස ගෙවීම් වාර්තාව

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-
2022 නොවැම්බර් මස ගෙවීම් වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී ප්‍රේමා ගම්ලත් මිය :-
2022 නොවැම්බර් ගෙවීම් වාර්තාව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා :-
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-
ආහාර පනත කටයුතු සඳහා ඉන්ධන ලබාදිම ඒ කටයුතු පිලිබඳ වාර්තාවක් ලබාදෙන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

> **Xxxxxxxxxxxxxxx** 2022 අප්‍රියෙල් මස ගෙවීම් වාර්තාව **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**08. වෙනත් කරුණු.**

**08-01.හෙල බොජුන් හල -ව්‍යාපෘති වාර්තාව සම්බන්ධව.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා :-
**ඇස්තමේන්තුව හදලා තියෙනවා.එය සබාගත කරමි.මේ අවස්ථාවේ මම මේ ව්‍යාපෘති වාර්තාව ද සභාගත කරමි. ඒ අනුව සභාවට බදු මුදල් ගෙවන්න ඒ ස්ථානය ඉදිකරලා දෙනවද? නැත්නම් භූමිය අපිට දීලා අපි හදාගන්නද?හෙල බොජුන් කොටස දේශීය අත්කම්,මල් අලෙවිය,දේශීය ආහාර ආදිය සඳහා.ලබාදෙමු.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

බිම දීලා හැදුවත් සභාවෙන් අධීක්ෂනය විය යුතුයි.සැලසුමක් අනුව එක කොටසක් විධිහට හදල කැලි වෙන් කැරලා ව්‍යාපාරික ස්ථාන ලබාදෙමු.කාර්මික නිලධාරි අධික්ෂනය කල යුතුයි.වෙළඳ බලපත්‍ර ගත යුතුයි.එසේම හෙල බොජුන් හල නෛතිකව සියල්ල සිදුවිය යුතුයි.ලහට යන පාර නිරවුල්ව තිබිය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

ආදායම් පරිපාලක මගින් වාර්ෂික තක්සේරුව බලලා බදු නිශ්චය කල යුතුයි.සාමූහිකව හෝ සමිතිය මගින් මේ බද්ද ගෙවිය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා :-

ගහට බහින්න වෙනම මාර්ගය තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී නයනා ජීවනි මිය :-

මේ සියල්ල වෙන්නේ වෙනම ක්‍රමයකට.මමත් දුන්න යෝජනාවක්.හෙල බොජුන් හලට. කාන්තා කමිටුව හරහා.සභාවට හොඳ ආදායමක් ලැබිය හැකි ලෙස.ඔය කියන ස්වයං රැකියා සංගමයේ අපි ඉන්නවද? කාන්තාවෝ 10 ඉන්නවද?

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

ප්‍රතිපාදන දීලා ඉදිකිරීම කරන්න මුදල් නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී දයා කස්තුරි මිය :-

සමිතියකට දෙනවා කීවේ.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

මේ පිරිස එකතු වෙලා ක්‍රමවේදයක් හදලා කටයුතු කරන්න.මන්ත්‍රීතුමියන්ලා 10 එකතු වෙලා සම අයිතීන් තියාගෙන ගැලපෙන ක්‍රමයක් හදන්න.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

මන්ත්‍රීතුමියන්ලා 10 ඉන්නවා.ඩිලාන් මන්ත්‍රීතුමා ඉන්නවා.බොතේජු මන්ත්‍රීතුමා ඉන්නවා.

ස්වයං රැකියා ලාභී එකතුව කුරුවිට ලෙස කරන්න.ගමේ නිශ්පාදන අලෙවි වෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී නයනා ජීවනි මිය :-

ක්‍රමය හදලා තියෙන්නේ.අපේ දහ දෙනාගෙන්ම ප්‍රතිලාභීන් එක් අයෙකුට බැගින් තම නිශ්පාදන අලෙවි කරගන්න අවස්ථාව දෙන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

කුටි 12 ක්.අවශ්‍යයි.මන්ත්‍රීවරුන් නිර්දේශ කරන 12 ට දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා :-

**12ට බෙදලා හදමු. කෘෂි අධ්‍යක්ෂ තුමාගේ ඉල්ලීම අනුව කාබනික නිශ්පාදන සඳහා වන කොටසට ඇස්තමේන්තුව ලක්ෂ 10 යි.මේක වෙනම කොටසක්.පාරෙන් එහා පැත්තේ.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා :-</u>**

**10 දෙනාට ඒ ස්ථාන දුන්නට පස්සේ ඩිලාන් මන්ත්‍රිතුමාටයි බොතේජු මන්ත්‍රිතුමයි ඉල්ලා සිටින ඒ දේශීය නිෂ්පාදන අලෙවි කටයුතුවලට කුටි දෙකයි. ඒ ඩිලාන් මන්ත්‍රි තුමාට දෙන කුටියේ තමා අර කාබනික පෝර අලෙවියත් සිදු කරන්න වෙන්නේ.නැත්නම් කුටි දෙකක් වෙනවා.**

**08-2.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>**

අර්බුධ රැසක් මැද සභා කාලය තුල සාර්තකව කටයුතු කලා.පක්ස විපක්ෂ හැමෝම සමගියෙන් කටයුතු කලා.පොදු තින්දු ගත්තා.සමහර කාර්යන් අතපසු අනා.නව වසර හොඳින් කලමනාකරනය කරගෙන ඉලක්ක වෙත යමු.සියළු දෙනාට සුභ පතමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ප්‍රේමා ගම්ලත් මිය.</u>**

ගතව ගිය සභා ධූර කාලය තුල යම් අයෙකුට වරදක් අනානම් සමාවෙන්න.ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මන්ඩලය ලේකම්තුමිය ඇතුළු සියළු දෙනාට ස්තුතිකරමි.ලබන නව වසර ට සියළු දෙනාටම සුබ පතමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා :-</u>**

සහෝදරත්වයෙන් යුක්තව මේ සභා කාල සිමාව තුල කටයුතු කලා.අපි මොන වාද කලත් සුහද මිතුරන්.2023 වසර සියළු දෙනාටම ජය පතමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-</u>**

කර්මාන්තපුර ඉඩම් සම්බන්ධ කමිටුව නිර්දේශ දෙනවට මුදලක් අයකරන්න.පරික්ෂන ගාස්තු ලෙස රු5000.00ක්. ගමකින් නම් රු.500.00 ක් ගන්න.ක්‍රමවේද හදන්න.හිස් ඉඩම් තියෙනවා. තසල තෝරන්නහරි සභාවට පවරා ගන්න.

09. හදිසි යෝජනා

09- 01.පත්බේරිය නාරද මධ්‍ය මහා විද්‍යාලය ජාතික පාසැලක් බවට පත් කිරිම-වැඩසටහන සංවිධාන කටයුතු සඳහා වු අයවැය සම්බන්ධව යෝජනාව.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා</u>**

පත්බේරිය නාරද මධ්‍ය මහා විද්‍යාලය ජාතික පාසැලක් බවට පත් කිරිම-වැඩසටහන සංවිධාන කටයුතු සඳහා වූ අයවැය සම්බන්ධව වාර්තාවක් පාසැල ඉදිරිපිට ප්‍රදර්ශනය කිරීමට කටයුතු සලසන ලෙස අදාල අංශ වලින් ඉල්ලා සිටිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථීර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

ජාතික පාසැලක් බවට පත් කිරිම-වැඩසටහන සංවිධාන කටයුතු සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය හරහා වෙන්කරන ලද මුදලට අමතරව ප්‍රදේශයේ ස්වේච්ජා සංවිධාන හා දානපති ආධාර හා විශාල ශ්‍රම හා ධන පරිත්‍යාගයක් ලැබුනා.මේ උත්සවයට ආදි ශිෂ්‍ය සංගමය ගේට්ටුව

හැදුවා.සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමත් ආවා.ඉන්ටර්නෙට් විධිමත් අධ්‍යාපනය ලබන්න ක්‍රමවේද ඇරඹුවා.එතුමාත් ලක්ෂ 10ක් දෙනවා කීවා.ගේට්ටුවට.මේ සම්බන්ධ වැඩකටයුතු දැන් නිමවෙලා තියෙන්නේ.ඒ නිසා වැඩසටහන සංවිධාන කටයුතු සඳහා වූ අයවැය සම්බන්ධව වාර්තාවක් පාසැල ඉදිරිපිට ප්‍රදර්ශනය කිරීමට කටයුතු සලසන ලෙස විදුහලේ විදුහල්පතිතුමා,කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, වෙතින් ඉල්ලා සිටීමට කටයුතු කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා_ගේ හදිසි යෝජනාව අනුව** පත්බේරිය නාරද මධ්‍ය මහා විද්‍යාලය ජාතික පාසැලක් බවට පත් කිරිමේ වැඩසටහන සංවිධාන කටයුතු සඳහා වූ අයවැය සම්බන්ධව වාර්තාවක් පාසැල ඉදිරිපිට ප්‍රදර්ශනය කිරීමට කටයුතු සලසන ලෙස විදුහලේ විදුහල්පතිතුමා,කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, වෙතින් ඉල්ලා සිටීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

9-02. නිවාඩු අනුමත කිරීම

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් ජයසූරිය මහතා මුදිතා ශ්‍රීමති මිය,රනිල් එදිරිසිංහ මහතා රංජිත් මෙන්ඩිස් මහතා හදිසියේ_අසනීප වි ඇති අතර නිවාඩු ලබා දිමට යෝජනා කරමි.හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද හදිසි යෝජනා අනුව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් ජයසූරිය මහතා මුදිතා ශ්‍රීමති මිය,රනිල් එදිරිසිංහ මහතා රංජිත් මෙන්ඩිස් මහතා හදිසියේ_අසනීප වී ඇති අතර නිවාඩු ලබා දීමට** ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

- **ස්තූතිය.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා:-**

**අද දින අපිට සභාවේ සංග්‍රහ කටයුතු සිදු කලේ ගරු දීප්ති චන්දන මහතා.එතුමාට විශේෂයෙන් ස්තූතිය පල කරමි.එසේම** අද දින මහා සභාව සඳහා සහභාගිවී සහය ලබාදුන් සියළු දෙනා හට ස්තූතියයි. තවත් සභා ධුරකාලයක් ජනතාව වෙනුවෙන් කැප කලා.ඇත්තටම සතුටුයි. ලබන නව වසරත් සියළු දෙනාගේ පැතුම් ඉටුවන සුභ නව වසරක් වේවා පතමි.
සභාවේ කටයුතු ප.ව. 4.00 ට ට පමණ අවසන් කරන ලදී.

ප්‍රේමරත්න මල්කැකුළ
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

පිටපත් : -
01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)
02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)
03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)
04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන් සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන් හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට
05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන අවධානය යොමු කිරීමට
06.ප්‍රජා සංවර්ධන නිලධාරී(දැ.ග.පි.)

03. පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම. (2022.11.11)

04.සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන -

05.ප්‍රාදේශිය සභාව අමතා එවනලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන